# කුඩා අස්තිත්ත්ව සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතය
# (කුඩා අස්තිත්ත්ව සඳහා SLFRS)

# කුඩා අස්තිත්ත්ව සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතය
# (කුඩා අස්තිත්ත්ව සඳහා SLFRS)

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය
30ඒ, මලලසේකර මාවත,
කොළඹ 07

දුරකථන : 011 2352000
ෆැක්ස් : 011 2352067

**හිමිකම© 2015 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය**

සියලුම හිමිකම් ඇවිරිණි. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ලිඛිත අවසරය නොමැතිව මෙම ප්‍රකාශනයේ කිසිඳු කොටසක් මුළුමනින්ම හෝ කොටස් වශයෙන් හෝ පරිවර්තනය කිරීම, නැවත මුද්‍රණය කිරීම, නැවත පිටපත් කරවීම හෝ විද්‍යුත්, යාන්ත්‍රික, ඡායාපිටපත්කරණය හා වාර්තාකරණය ඇතුළුව නොදන්නා ලද මින්මතු නිපදවනු ලබන වෙනත් උපක්‍රමයක් යන කුමන ආකාරයකින් හෝ තොරතුරු ගබඩා කොට ආපසු ලබාගැනීමේ යම්කිසි පද්ධතියක් උපයෝගී කරගැනීම මගින් හෝ කළ නොහැකියි.

සීමාසහිත හෙක්ෆෝර්ට් ප්‍රින්ටර්ස් (පුද්ගලික) සමාගම විසින්
ශ්‍රී ලංකාවේදී මුද්‍රණය කරවා බැඳ සකස් කරවන ලදී.

**පාලක මණ්ඩලය**

| | |
|---|---|
| *සභාපති* | ඒ. හේරත් FCA, BSc, MA, MBA |
| *උප සභාපති* | එල්.එල්.එස්. වික්‍රමසිංහ FCA, FMAAT |
| *සාමාජිකයන්* | එස්. රාජපක්ෂ FCA, MBA, FSCMA |
| | එස්. බණ්ඩාර FCA, MBA, BSc (Accy.) Sp. |
| | ටී. ධර්මරාජා FCA, BSc, FMAAT, DA |
| | එම්. ජයසිංහ FCA, FCMA |
| | එස්. කුරුම්ඹලාපිටිය FCA, FCMA, CGMA |
| | එච්. කුරුප්පු FCA, BSc(Accy.) Sp. Hons, MBA, MEF, ASCMA |
| | සී. මනෝහරන් FCA, FCMA |
| | ඩී. නානායක්කර ACA, FCMA, CFSA, MSc. (Finance), D.C., BSc. (Sp) |
| | ඩබ්.ඩබ්.ජේ.සී. පෙරේරා FCA, BSc. (B.Admn.), CFE |
| | එම්.සී. පීටර්ස් FCA (මිය) |
| | එච්.ඒ.එස්. සමරවීර FCA, BCom(Sp.), ACMA, CCAF-FCVI |
| | ෂාන් ෂන්මුගනාදන් FCA, FCMA |
| | ටිෂාන් සුබසිංහ FCA, MBA (Finance) (Col.), CISA-USA, ACMA |
| | එල්. විජේවර්ධන FCA, MBA |
| *ලේකම්/ප්‍ර.වි.නි.* | අරුණ අල්විස් Dip. in Bus. Admin, AIMIS, MBA |

## **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත කමිටුව**

*සභාපති* ඩී.ටී.එස්.එච්. මුදලිගේ

*විකල්ප සභාපති* එච්.එම්.ජ්. ජයසිංහ

*සාමාජිකයන්* ටී.ජේ.එස්. රාජකාරියර්

නිෂාන් ප්‍රනාන්දු

නලින් ආටිගල

ඩී.එන්.ආර්. සිරිවර්ධන

හර්ෂන සූරියප්පෙරුම

එච්.එල්.එස්. ජයමාන්න ( මිය)

අර්ජුන හේරත්

අජිත් වීරතුංග

සංජීවනී කොටකදෙණිය ( මිය)

මනෝ රාජකාරියර්

*ලේකම්* උපේන්ද්‍ර විජේසිංහ

## කුඩා අස්තිත්ත්ව සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සංවර්ධනය කිරීමේ උප කමිටුව

*සභාපති* අජිත් රත්නායක

*සාමාජිකයන්* නිශාන් ප්‍රනාන්දු

සනත් ප්‍රනාන්දු

කපිල අතුකෝරළ

**තාක්ෂණික සේවක මණ්ඩලය**

| | |
|---|---|
| *තාක්ෂණික අංශ ප්‍රධානි* | උපේන්ද්‍ර විජේසිංහ |
| *තාක්ෂණ කළමනාකරුවන්* | හිරන්ති විජේතුංග (මිය) |
| | නිලංගි දිල්රුක්ෂි (මිය) |
| | සෞම්‍යා මධුභාෂිණී (මිය) |
| | රුවිනි සුබසිංහ (මෙය) |
| | නදීශානි පීරිස් (මෙය) |
| *ජාත්‍යන්තර සම්බන්ධීකරණ නිලධාරි* | ප්‍රබෝධා දවුලගල (මෙය) |
| *සාමායෝජක* | ඉෂ්වි ෂෙරීෆ් |
| *ලේකම්වරු* | බුද්ධිනි චන්ද්‍රසේන (මිය) |
| | සරසි වීරසිංහ (මිය) |
| | සමන්ති පෙරේරා (මෙය ) |

## 2015 සංස්කරණය සඳහා සභාපතිතුමාගේ පණිවුඩය


කුඩා අස්තිත්ත්ව සඳහා නව ගිණුම්කරණ ප්‍රමිතයක් ප්‍රකාශයට පත්කොට නිකුත් කිරීම මේ රටේ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රසිද්ධකොට ක්‍රියාත්මක කිරීමේ ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථානයකි. මෙය වාණිජ ලෝකයේ කුඩා පරිමාණ ව්‍යවසාය ඛණ්ඩයට වඩාත් අදාල වන්නා වූ ගිණුම්කරණ මූලධර්ම සහ ජාත්‍යන්තර න්‍යායයන් භාවිතයට ගෙන නිර්මාණයකර ඇති දේශීය ගිණුම් ප්‍රමිතයකි. කුඩා ඒවායේ සිට ක්ෂුද්‍ර ඒවා දක්වා වූ ව්‍යවසායයන් විසින් ඒවා සඳහාම වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ ප්‍රතිඵල විලසින් රටේ ආර්ථික සංවර්ධනයට සහ ප්‍රගතියට දායක වනු දැකීම අප ඉතසිතින් අපේක්ෂා කරන ප්‍රාර්ථනයයි.

විස්තරාත්මක වූ ද විශ්වසනීය වූ ද මූල්‍ය ප්‍රකාශන, ව්‍යාපාරයක් වඩාත් ලාභදායී අන්දමින් නොනවත්වා පවත්වාගෙන යාම කළමනාකරණය කර ගැනීම සඳහා තොරතුරු සකසා දෙන අතර, විශ්වසනීය මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කොට තබාගැනීම වෙනුවෙන් දරනු ලබන පිරිවැය කිසිවක් වෙතොත්, ප්‍රමාණානුකූලව බලන කල එම පිරිවැය ඉක්මවා හිලව් කිරීමට තරම් හේතුවනු ඇත.

රටේ ගිණුම්කරණ රාමුවට මෙම ප්‍රමිතය ඇතුළත් කිරීම, කුඩා අස්තිත්ත්ව අතර ඉතාමත් කුඩා අස්තිත්ත්වයට ද, මූල්‍ය වාර්තාකරන ක්‍රියාවලියට සඵලදායී ලෙස සහභාගී වී, ගිණුම්කරණ ප්‍රමිතයේ ප්‍රතිලාභ ලොකු බරක් ආරවුලක් නොමැතිව නෙලා ගැනීම සඳහා උපකාරීවීම සහතික කෙරෙනු ඇත. එය SLFRS සහ කුමපඅසඳහා SLFRS ට වඩා සංකීර්ණ භාවයෙන් සැලකිය යුතු අන්දමින් අඩු නිසා, සහ මූල්‍ය ප්‍රකාශන කුඩා අස්තිත්ත්වවලට අදාළ පාර්ශ්වකරුවන් අතර වඩාත් පරිශීලක සුහදබවින් යුක්ත නිසා, සහ නිෂ්පාදනයේදී පිරිවැය ඵලදායී සහිත වන බැවින්, කුඩා අස්තිත්ත්ව සඳහා SLFRS හෝකුමපඅසඳහා වූ SLFRS භාවිත කිරීමේදී මතුවිය හැකි මූල්‍ය වාර්තාකරන බර ලිහිල් කොට පහසුවක් සැලසීමට මෙම ප්‍රමිතය උපකාරවනු ඇතැයි අපි විශ්වාස කරමු.

ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අපගේ ගිණුම්කරණ ප්‍රමිත සමග සංසරණය කොට 2012 දී මේ රටේ ක්‍රියාත්මක කිරීම පැලපදියම්වීමේදී කුඩා ව්‍යවසායයන් හා කුඩා සහ මධ්‍යම වෘත්තියේ නියැලෙන්නන් කොන්වීමක් සිදුනොවීම මෙම ප්‍රමිතය හඳුන්වාදීම තුළින් සහතික කරනු ඇතැයි අපි විශ්වාස කරමු.

මෙහි මුලපිරීම සඳහා ඔවුන් දැක්වූ සහයෝගය වෙනුවෙන් Deutsche Gesellschaft fur Internationale Zusammenarbeit වෙතද ඉතාමත් වැදගත් මෙම ගිණුම්කරණ ප්‍රමිතය වර්ධනය කිරීමෙහිලා ඉටුකළ මාහැඟි කාර්යභාරය වෙනුවෙන් ගිණුම්කරණ ප්‍රමිත කමිටුවේ සභාපති සහ සාමාජිකයන් වෙතද මාගේ කෘතඥතා පූර්වක ඇගයීම පළ කරමි.



**සභාපති**
**ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය**

**පෙරවදන**

ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාශයට පත්කිරීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ පාලක මණ්ඩලයට සහායවීම පිණිස 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිත පනත යටතේ 1996 දී ගිණුම්කරණ ප්‍රමිත කමිටුව (ASC) පිහිටුවන ලදී.

කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ අස්තිත්ත්ව සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතය (කුමපඅසඳහා වූ SLFRS) පාලක මණ්ඩලය විසින් 2011 දී පිළිගන්නා ලදී.

කෙසේ වුවත්, කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායයන්ගෙන් කුඩා සහ මධ්‍යම ව්‍යවසායන් සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතයටත් වඩා සරල මූල්‍ය වාර්තාකරන ප්‍රමිතයක් සඳහා විශාල ඉල්ලුමක් පවතී. සංකීර්ණභාවය නිසා කුමපඅ සඳහා වූ SLFRSපිළිගැනීම පහත මට්ටමක පවත්නා බව නිරීක්ෂණය කිරීමෙන් පසු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය කුඩා අස්තිත්ත්වයන් සඳහා වූ SLFRSසතුටින් හඳුන්වා දෙයි. මෙම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතය වෙනස් මූල්‍ය වාර්තාකරණ රාමුවක් මත පාදක වූවක් වන අතර ක්‍රියාත්මක වන්නේ 2016 ජනවාරි 01 දින හෝ ඉන්පසු ආරම්භවන මූල්‍ය කාලච්ඡේද සඳහාය.

පිරිවැය ඵලදායී වියහැකි වූද, මූල්‍ය වාර්තාකරණය නව මානයන් ඔස්සේ ගෙනයනු ඇතැයි අපේක්ෂා කළ හැකි වූද, කුඩා අස්තිත්ත්ව සඳහා වූ SLFRS තුළින් ශ්‍රී ලංකාවේ කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ අස්තිත්ත්ව මෙම ප්‍රයත්නයේ ප්‍රතිලාභ නෙලාගනු ඇතැයි මට විශ්වාසයයි.

ප්‍රමිත සකස්කරණය කිසි ලෙසකින්වත් ලේසි පහසු කාර්යයක් නොවේ. ඒ සඳහා අතිවිශාල ප්‍රමාණයේ තාක්ෂණ යෙදවුමක් අවශ්‍ය කෙරේ. මේ සම්බන්ධයෙන් ගිණුම්කරණ ප්‍රමිත කමිටුවට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ තාක්ෂණ අංශයේ අසීමිත සහයෝගය ලැබීමේ වරප්‍රසාදය හිමිවී තිබුණි.

කුඩා අස්තිත්ත්වයන්හි මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතා ඉටුකරලීම සඳහා සැලසුම් කොට සකස් කළ මෙම දේශීය SLFRSය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයන්ගෙන් සැදුම්ලත් අජිත් රත්නායක මහතාගේ සභාපතිත්වයෙන් යුතු අනුකමිටුවක අප්‍රතිහත පරිශ්‍රමයේ ප්‍රතිඵලයකි. එම නිසා ආයතනයේ අත්‍යන්ත අරමුණ වන ශ්‍රී ලංකාවේ ගිණුම්කරණ හා විගණන ප්‍රමිත විධිමත් ලෙස සකස් කිරීම සාක්ෂාත් කරගැනීම කෙරෙහි දක්වා ඇති අඛණ්ඩ දායකත්වය වෙනුවෙන් අනුකමිටුව සහ ආයතනයේ තාක්ෂණ කාර්යමණ්ඩලය සියලුම පාර්ශ්වකරුවන්ගේ නොමද කෘතඥතාව ලැබීමට සුදුස්සෝ වන්නේය.

**සුජීව මුදලිගේ**
**සභාපති**
**ගිණුම්කරණ ප්‍රමිත කමිටුව**
**2015 සැප්තැම්බර් 25**

## අනුකමිටු සභාපතිතුමාගේ පණිවුඩය

මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පමය රාමුවේ (SLFRSs) QC35 ඡේදයෙහි මූල්‍ය තොරතුරු වාර්තාකරණය පිරිවැයක් පනවන බවද එම තොරතුරු වාර්තාකරණයෙන් අත්වන ප්‍රතිලාභ මගින් එම පිරිවැය සාධාරණීය කරණය කිරීම වැදගත් වන්නේයැයි ද සඳහන් කරයි. QC 39 ඡේදය තවදුරටත් දක්වන්නේ පිරිවැය සහ ප්‍රතිලාභ තක්සේරු කිරීම් සෑමවිටම සියලුම අස්තිත්ත්වයන් සඳහා එකම වාර්තාකරන අවශ්‍යතා සාධාරණීය කිරීමක් නොකරනු ලැබිය හැකි අතර, අස්තිත්ත්වයන්හි ප්‍රමාණවල වෙනස්කම් නිසාද, ප්‍රාග්ධනය රැස්කිරීමේ වෙනස්ක්‍රම (පොදු හෝ පුද්ගලික) නිසාද වෙනත් පරිශීලක අවශ්‍යතා නිසා හෝ අනෙකුත් සාධක නිසා වෙනස්කම් තිබීම යෝග්‍ය විය හැකි බවය.

කුඩා අස්තිත්ත්ව සඳහා වූ SLFRSකෙටුම්පත් කරන ලද්දේ කුඩා අස්තිත්ත්ව සම්බන්ධයෙන් ඉහත දෑ සිදුකිරීමටය. මෙම ප්‍රමිතය භාවිතයෙන් මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කරන්නන් විගණකයක් සහ කුඩා අස්තිත්ත්ව මූල්‍ය ප්‍රකාශ පරිශීලකයන් අමිල ප්‍රතිලාභ ලබනු ඇතැයි මගේ විශ්වාසය.

ශ්‍රී ලංකා ව.ග ආයතනයේ සභාපති තුමාටද පාලක මණ්ඩලයට ද, ගිණුම්කරණ ප්‍රමිත කමිටුවටද අනු කමිටු සාමාජිකයන්ටද මත ප්‍රකාශ සඳහා විවෘත කළ කෙටුම්පත මත අදහස් ලියා එවා, ප්‍රමිතය කෙටුම් කිරීම සඳහා දායකත්වය අපේක්ෂාවෙන් පැවැත්වූ රැස්වීම් වට දෙකට සහභාගී වූ සෑම දෙනාටත් ස්තුති කිරීමට කැමැත්තෙමු.

**අජිත් එස්. රත්නායක**
**සභාපති,**
**කුඩා අස්තිත්ත්ව සඳහා ශ්‍රීලමුවා ප්‍රමිත වර්ධන අනු කමිටුව**
**2015 අගෝස්තු 25**

පොදු මහජනයා ඉතා ඉහළ මට්ටමක උනන්දුවක් දක්වන බොහෝ ව්‍යාපාරවල / අස්තිත්ත්වයන්හි මූල්‍ය වාර්තා ඒ අයට පහසුවෙන් ලබාගත හැකි අතර පොදු මහජන සාමාජිකයන් ආර්ථික තීරණ ගැනීම සඳහා එම මූල්‍ය ප්‍රකාශන භාවිතා කරයි. එම නිසා එවැනි ව්‍යාපාර SLFRSs සමග අනුකූලව කටයුතු කිරීම අවශ්‍ය කෙරේ. වෙනත් ව්‍යාපාර ඒවායේ මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණයේ අස්තිත්ත්ව කුමපඅ සඳහා වන ශ්‍රීලගිප්‍ර අනුව පිළියෙළ කළ හැකිය. කෙසේ වෙතත් කුඩා අස්තිත්ත්ව / ව්‍යාපාර සඳහා කුඩා හා මධ්‍ය පරිමාණයේ අස්තිත්ත්ව සඳහා වන SLFRSs සහ SLFRS වඩාත් සංකීර්ණ වන අතර කුඩා අස්තිත්ත්ව සඳහා ඒවා අනුගමනය කිරීම පහත සඳහන් හේතු නිසා පිරිවැය අතින් එතරම් පිරිමැසුම්දායක නොවිය හැක.

(අ) කුඩා අයභාරය, ස්කන්ධය සහ වගකීම්; සහ

(ආ) අතිරේක තොරතුරු ඉල්ලුම් කිරීමේ හැකියාව පවතින ඇල්මක් දක්වන පාර්ශ්ව වලට පමණක් මූල්‍ය ප්‍රකාශන ලබාගැනීමට ඇති හැකියාව.

කුඩා අස්තිත්ත්ව සඳහා වන SLFRS සරල මූල්‍ය වාර්තාකරන ගිණුම්කරණ ප්‍රමිතයක් වන අතර එය කුඩා අස්තිත්ත්ව වලට පිරිමැසුම් දායක පිරිවැයකින් භාවිතයට යොදවා ගත හැකිය. පහත සඳහන් දෑ නොවන ඕනෑම අස්තිත්ත්වයක් එම ප්‍රමිතය භාවිතා කළ හැකිය.

(අ) වාර්තාකරනු ලබන කාල පරිච්ඡේදයක් තුළ රු. මිලියන 100 ඉක්මවන අයභාරයක් තිබූ අස්තිත්ත්වයක්;

(ආ) පෙර වූ වාර්තා කරන කාල පරිච්ඡේදය අවසානයේ රු. මිලියන 50 ඉක්මවන ස්කන්ධයෙක් තිබූ අස්තිත්ත්වයක්

(ඇ) සමාගම්වලට අදාළ නීති අනුව සමූහ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතු සමාගමක්

(ඈ) අස්තිත්ත්වයක ප්‍රධාන ව්‍යාපාරික කටයුතුවලින් එකක් ලෙස භාරයක තත්ත්වයෙන් වත්කම් තබාගෙන ඇති අස්තිත්ත්වයක්.

අනෙක් දේවල් අතර මෙම ප්‍රමිත පහත දක්වෙන ලිහිලි කිරීම්/ සරල කිරීම් ඇතුළත්ය.

(අ) මූල්‍ය සාධන පත්‍ර සම්බන්ධයෙන් සංකීර්ණ අවශ්‍යතාවයන් ඉවත් කර ඇත.

(ආ) සාධාරණ වටිනාකම, ප්‍රයෝජ්‍ය අගය සහ ආයු ගණන අගය කිරීම් සම්බන්ධයෙන් වන සංකීර්ණ අවශ්‍යතාවයන් ඉවත් කර ඇත.

(ඇ) අයිතමයන් මිනුම්කරණය තවදුරටත් සරලකර ඇත. උදාහරණ වශයෙන් කල්බදු බොහෝමයක් සරල රේඛීය පදනම මත මිණුම්කරණය තොග පිරිවැයේ පොදුකාර්ය පිරිවැය ඉවත් කිරීම වත්කමක පිරිවැයෙහි ණයගැනීමේ පිරිවැය ඉවත් කිරීම, වාර්තා කරන දින සේවකයෙක් සේවයෙන් ඉවත් වන්නේ නම් ගෙවිය යුතු පාරිතෝෂිත දීමනාවේ වගකීම විශ්‍රාම පාරිතෝෂිකය මිනුම්කරණය සහ නිවාඩු ලබාගත් කාලපරිච්ඡේදයේදී නිවාඩු සඳහා වන පිරිවැය හඳුනාගැනීම මගින්.

(ඈ) තුලනාත්මක තොරතුරු වෙනස් කිරීමේ අවශ්‍යතාවය නොමැතිව, ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම් පූර්ව කාලපරිච්ඡේදවල වැරදි නිවැරදි කිරීම වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදයේ ආරම්භක රඳවාගත් ඉපයීම්වලට ගැලපුමක් ලෙස ඉදිරිපත් කිරීම.

(ඉ) SLFRS වලට අනුකූලව කුඩා අස්තිත්ත්ව සඳහා පිළියෙළ කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල ප්‍රථම වාර්තාකරනු ලබන කාලපරිච්ඡේදයේ ආරම්භය, සංක්‍රමනය වන දිනය ලෙසට පත්කිරීම මගින් කුඩා අස්තිත්ත්ව SLFRS සඳහා සංක්‍රමනය වීම ලෙහෙසි කර ඇත.

(ඊ) හෙළිදරව් කිරීමට අදාළ අවශ්‍යතාවයන් සැලකියයුතු අන්දමින් අඩුකර ඇත.

(උ) විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සහ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය වෙනුවට ලාභ හෝ අලාභ ප්‍රකාශනය සහ රඳවාගත් ඉපයීම් ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය.

(ඌ) කුඩා අස්තිත්ත්වයක් නියලෙනු නොවනු ඇතැයි සැලකෙන ක්‍රියාකාරකම් සහ ගනුදෙනු හා සම්බන්ධිත අවශ්‍යතාවයන් ඇතුළත් කර නොමැත.

## කුඩා අස්තිත්ත්ව සඳහා වන SLFRS වෙත ප්‍රස්ථාවනාව

1. කුඩා අස්තිත්ත්ව සඳහාවන SLFRS හි අරමුණ වනුයේ පිරිවැය අතින් පිරිමැසුම්දායක ලෙස කුඩා අස්තිත්ත්ව වලට භාවිත කළ හැකි සරල මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතයන් සම්පාදනය කිරීමය.

2. කුඩා අස්තිත්ත්ව සඳහා වන SLFRS ය භාවිත කළ හැකි අස්තිත්ත්ව මොනවාදැයි මෙම ප්‍රමිතයේ 1 වන පරිච්ඡේදයේ පැහැදිලිව සඳහන් කර ඇත.

3. කුඩා අස්තිත්ත්ව සඳහා වන SLFRS ය කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්ත්ව සඳහා වන SLFRSs හෝ SLFRS වලට යොමුනොකර කියවීම, අර්ථනිරූපණය කිරීම හෝ ව්‍යවහාර කළ හැකිය.

4. කුඩා අස්තිත්ත්ව සඳහා වන SLFRSs සංකල්ප සහ පෘතුල මුලධර්ම මෙම ප්‍රමිතයේ 2 වන ඡේදයේ සඳහන් කර ඇත. SLFRSs සඳහා වන සංකල්පමය ආකෘතිමය රාමුව සහ කුඩා අස්තිත්ත්ව සඳහාවන SLFRS හි පෘතුල මුලධර්ම කුඩා අස්තිත්ත්වවලට ව්‍යවහාර නොවේ.

5. කුඩා අස්තිත්ත්ව වල මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේදී ඒවායේ ප්‍රමාණය, සංකීර්ණභාවයේ මට්ටම, සම්පත් ලබාගතහැකි බව, ඒවා මත පිරිවැය පිරිමැසුම් දායකත්වයේ බලපෑම, කුඩා අස්තිත්ත්ව සඳහා වන මෙම SLFRS ය හඳුනාගනී. එබැවින් මෙම ප්‍රමිතයේ සඳහන් කර ඇති ඉදිපත් කිරීමේ මූලධර්ම, හඳුනාගැනීම සහ මිනුම්කරණය කුඩා හා මධ්‍ය ප්‍රමාණයේ අස්තිත්ත්ව සඳහා වන SLFRSs සහ SLFRS වල සඳහන් කර ඇති ඒවාට වඩා සරලය.

**පටුන**

## කුඩා අස්තිත්ත්ව සඳහා වන SLFRS ය.
**කුඩා අස්තිත්ත්ව සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතය**


| *පරිච්ඡේදය* | | *පිටු අංකය* |
|---|---|---|
| 1 | මෙම SLFRS හි විෂය පථය | 1 |
| 2 | සංකල්ප සහ පෘතුල මූලධර්ම | 1 |
| 3 | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම | 3 |
| 4 | ගිණුම්කරණ ප්‍රතිපත්ති, ඇස්තමේන්තු සහ වැරදි | 10 |
| 5 | තොග | 14 |
| 6 | දේපළ පිරියත සහ උපකරණ | 17 |
| 7 | කල්බදු | 22 |
| 8 | සේවක ප්‍රතිලාභ | 23 |
| 9 | අයභාරය | 25 |
| 10 | ප්‍රතිපාදන සහ අසම්භවාය්‍යයන් | 30 |
| 11 | ණය ගැනීමේ පිරිවැය | 33 |
| 12 | විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනය | 34 |
| 13 | සම්බන්ධිත පාර්ශ්ව හෙළිකිරීම | 36 |
| 14 | රාජ්‍ය ප්‍රදාන | 38 |
| 15 | වෙනත් වත්කම් සහ වගකීම් | 39 |
| 16 | වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදය අවසනට පසු සිදුවීම් | 41 |
| 17 | කුඩා අස්තිත්ත්ව සඳහා SLFRS වෙත සංක්‍රමණය වීම | 43 |
| | නිදර්ශනාත්මක මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම | i |
| | SLFRSs සමග සැසඳීම | iv |
| | කුමපඅ සඳහා SLFRS සමග සැසඳීම | vi |

## *1 වන පරිච්ඡේදය - මෙම SLFRSහි විෂය පථය*

### හැඳින්වීම

1.1 මෙම පරිච්ඡේදයේ පැහැදිලිව සඳහන් කර ඇති තේරුම අනුව කුඩා අස්තිත්ත්වයක මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා කුඩා අස්තිත්ත්ව වල SLFRS සඳහා මෙම ප්‍රමිතය භාවිත කළ හැකිය.

### කුඩා අස්තිත්ත්ව

1.2 පහත සඳහන් දෑ නොවන ඕනෑම අස්තිත්ත්වයක් කුඩා අස්තිත්ත්වයකි.

(අ) වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදය තුළ රු. මිලියන 100 ක් ඉක්මවූ අයභාරයක් තිබූ අස්තිත්ත්වයක්;

(ආ) පෙර වූ වාර්තාකරන කාලපරිච්ඡේදය අවසානයේ රු. මිලියන 50 ක් ඉක්මවන ස්කන්ධයක් තිබූ අස්තිත්ත්වයක්;

(ඇ) සමාගම්වලට අදාළ නීතිය අනුව සමූහ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතු සමාගමක්; හෝ

(ඈ) අස්තිත්ත්වයක ප්‍රධාන ව්‍යාපාරික කටයුතු වලින් එකක් ලෙස භාරයක තත්ත්වයෙන් වත්කම් තබාගෙන ඇති අස්තිත්ත්වයක්

## *2 වන පරිච්ඡේදය - සංකල්ප සහ පෘතුල මූලධර්ම*

### මූල්‍ය ප්‍රකාශනවල අරමුණු

2.1 මෙම ප්‍රමිතයට අනුකූලව පිළියෙළ කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල අරමුණ වනුයේ කුඩා අස්තිත්ත්වයක මූල්‍ය ප්‍රකාශන වාර්තා කරනු ලබන අස්තිත්ත්වයේ මූල්‍ය තොරතුරු පරිශීලකයනට ප්‍රයෝජනවත් අයුරින් පිරිමැසුම්දායක පිරිවැයකින් ලබාදීමයි.

### වත්කම්, වගකීම් සහ ස්කන්ධය

2.2 වත්කම්, වගකීම් සහ ස්කන්ධය පහත පරිදි නිර්වචනය කෙරේ:

(අ) වත්කමක් යනු අතීත සිදුවීම හේතු කොටගෙන අස්තිත්ත්වයක් විසින් පාලනය කරනු ලබන ප්‍රවර්තන ආර්ථික සම්පතකි;

(ආ) වගකීමක් යනු අතීත සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස ආර්ථික සම්පතක් පැවරීමට අස්තිත්ත්වයක ඇති ප්‍රවර්තන බැඳීමකි; සහ

(ඇ) ස්කන්ධය යනු අස්තිත්ත්වයේ වත්කම්වලින් එහි සියලු වගකීම් අඩුකළ පසු අවශේෂ වන ඇල්මය.

### ආදායම් සහ වියදම්

2.3 ආදයම් සහ වියදම් පහත දැක්වෙන පරිදි නිර්වචනය කර ඇත:

(අ) ආදායම යනු ගිණුම්කරණ කාල පරිච්ඡේදය තුළ ඇතුළට ගලාඒම් හෝ වත්කම් වැඩිකිරීමේ හෝ වගකීම් අඩුකිරීමේ ස්වරූපයෙන් ස්කන්ධ ආයෝජකයන්ගෙන් ලැබෙන දායකවීම් වලට සම්බන්ධ ඒවා හැර ස්කන්ධය ඉහළ නැංවීමට හේතුවන ආර්ථික ප්‍රතිලාභවල වැඩිවීමයි;

(ආ) වියදම් යනු ගිණුම්කරණ කාලපරිච්ඡේදය තුළ පිටතට ගලායාම් හෝ වත්කම් ක්ෂයවීම් හෝ වගකීම් හටගැනීමේ ස්වරූපයෙන් ස්කන්ධ ආයෝජකයන් හට බෙදාහැරීම් හැර, ස්කන්ධය අඩුවීමට හේතුවන ආර්ථික ප්‍රතිලාභවල අඩුවීමයි.

## වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් හඳුනාගැනීම

2.4 වත්කමක, වගකීමක ආදායම් හෝ වියදම් යන ඒවා පහත සඳහන් නිර්ණායක සපුරාලන්නේ නම්, අයිතමයක් හඳුනාගත යුතුය. (එනම්: මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇති):

(අ) අයිතමය හා ආශ්‍රිත යම් අනාගත ආර්ථික ප්‍රතිලාභ අස්තිත්ත්වයට ගලාඒම හෝ ගලායාම අපේක්ෂා කළ හැකිවීම (එනම් නොසිදුවීමට වඩා බොහෝ දුරට සිදුවිය හැකි);

(ආ) විශ්වාසදායක ලෙස මැනිය හැකි පිරිවැයක් හෝ වටිනාකමක් ඇති අයිතමයක්.

## උපචිත පදනම

2.5 අස්තිත්ත්වයක් උපචිත පදනම් ගිණුම්කරණය භාවිත කර එහි මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතුය. උපචිත පදනම මත අයිතමයක් වත්කම්, වගකීම්, ස්කන්ධය ආදායම හෝ වියදම් ලෙස හඳුනාගන්නේ ඒවා එම අයිතම සඳහා ඇති නිර්වචනය සපුරාලන විටය.

# *3 වන පරිච්ඡේදය - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම*

## සාධාරණ ඉදිරිපත් කිරීම

3.1 අස්තිත්ත්වයක මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්යසාධනය මූල්‍ය ප්‍රකාශන වල සාධාරණ ලෙස ඉදිරිපත් කළ යුතුය.

## කුඩා අස්තිත්ත්ව සඳහා SLFRS සමග අනුකූල වීම

3.2 මෙම ප්‍රමිතයේ අවශ්‍යතාවයන් සපුරාලන සහ එහි මූල්‍ය ප්‍රකාශන මෙම ප්‍රමිතය සමග අනුකූලවන අස්තිත්ත්වයක් මූල්‍ය ප්‍රකාශනවල සටහන් තුළ කුඩා අස්තිත්ත්වයන් සඳහා වන SLFRS සමග අනුකූල වන බවට ප්‍රකාශනයක් කළ යුතුය.

## අඛණ්ඩ පැවැත්ම

3.3 අඛණ්ඩව පවත්වාගෙන යාමට අස්තිත්ත්වයේ හැකියාව පිළිබඳව කළමනාකරිත්වය තක්සේරුවක් කළ යුතුය. කළමනාකාරිත්වය විසින් එක්කෝ ඈවර කිරීමට අපේක්ෂා කරන්නේ නම් හෝ මෙහෙයුම් නැවැත්වීමට හෝ එසේ කිරීම හැර වෙනත් යථාර්ථවාදී විකල්පයක් නොමැත්තේ නම් හැර අස්තිත්ත්වයකට අඛණ්ඩ පැවැත්මක් ඇත. අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනය උචිත වන්නේද යන්න තක්සේරු කිරීමේදී අඩුතරමින් එහෙත් වාර්තාකරන දින සිට මාස දොළහක එයට සීමා නොකොට අනාගතය පිළිබඳව ලබාගත හැකි තොරතුරු කළමනකාරිත්වය සැලකිල්ලට ගනී. අස්තිත්ත්වයක් සිය තක්සේරුව කිරීමේදී අඛන්ඩ

පැවැත්ම අඛන්ඩව පවත්වාගෙන යාමේ හැකියාව මත සැලකිය යුතු අන්දමේ සැකයක් මතුවන ප්‍රමාණාත්මක අනියතා සම්බන්ධිත සිද්ධීන් හෝ තත්ත්වයන් පිළිබඳව අස්තිත්ත්වයක් දැනුවත් වූ විට එම අනියතා අස්තිත්ත්වය විසින් හෙළිදරව් කළ යුතුය.

## වාර්තා කිරීමේ වාර ගණන (සංඛ්‍යාතය)

3.4 අස්තිත්ත්වයක් සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් අඩු තරමින් වාර්ෂිකව ඉදිරිපත් කළ යුතුය.

## ඉදිරිපත් කිරීමේ සංගතතාවය

3.5 අස්තිත්ත්වයේ මෙහෙයුම්වල ස්වභාවයේ සැලකිය යුතු අන්දමේ වෙනසකට පසුව හෝ එහි මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීමේදී හෝ වෙනත් ඉදිරිපත් කිරීමක් හෝ වර්ගීකරණය කිරීමක් වඩා උචිත වන බව පැහැදිලිව පෙනෙන්නේ නම් හැර අස්තිත්ත්වයක් විසින් අයිතම ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය කිරීම මූල්‍ය ප්‍රකාශනවල එක කාලපරිච්ඡේදයක සිට ඊළඟ කාලපරිච්ඡේදයට එලෙසම රඳවා තබාගත යුතුය.

## තුළනාත්මක තොරතුරු

3.6 මෙම ප්‍රමිතය මගින් අවසර දී ඇති විටෙක හෝ අන් වශයෙන් අවශ්‍ය කරන්නේ නම් හැර, ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සියලුම වටිනාකම් සඳහා පෙරවූ සැසඳිය හැකි කාල කාලපරිච්ඡේදය සම්බන්ධයෙන් තුලනාත්මක තොරතුරු හෙළිදරව් කළ යුතුය.

## ප්‍රමාණාත්මකභාවය සහ සමාහරණය

3.7 තොරතුරු අත්හැරීම හෝ අවනිදේශනය මූල්‍ය ප්‍රකාශන පදනම මත ආර්ථික තීරණ ගනු ලැබූ පරිශීලකයනට තනි තනිව හෝ සාමූහිකව බලපාන්නේ නම් එම තීරණ ප්‍රමාණාත්මක වේ.

3.8 එය එසේ කිරීමෙන් වන බලපෑම ප්‍රමාණාත්මක නොවන්නේ නම් අස්තිත්ත්වයක් මෙම ප්‍රමිතයේ ඇති අවශ්‍යතාවයක් අනුගමනය කිරීම අවශ්‍ය නොවේ.

3.9 එක හා සමාන අයිතම්වල එක් එක් ප්‍රමාණාත්මක පන්ති වෙන් වෙන්ව අස්තිත්ත්වයක් ඉදිරිපත් කළ යුතුය. ස්වභාවය හෝ කාර්යයන් අනුව අයිතමයන් අසමාන වන්නේ නම් හැර ඒවා වෙන් වෙන්ව ඉදිරිපත් කළ යුතුය.

## සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටල

3.10 අස්තිත්ත්වයක සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයකට පහත සඳහන් සියලු දෑ ඇතුළත් විය යුතුය:

(අ) වත්කම් සහ වගකීම් ප්‍රකාශනයක්;

(ආ) වාර්තාකරනු ලබන කාලපරිච්ඡේදය සඳහා ලාභ හෝ අලාභ සහ රඳවාගත් ඉපයීම් ප්‍රකාශනයක්;

(ඇ) වාර්තාකරනු ලබන කාලපරිච්ඡේදය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක්; සහ

(ඈ) වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශයක් සහ වෙනත් සවිස්තරාත්මක තොරතුරු අඩංගු සටහන්.

## මූල්‍ය ප්‍රකාශන හඳුනාගැනීම

3.11 අස්තිත්ත්වයක් එක් එක් මූල්‍ය ප්‍රකාශන (සටහනක් ද ඇතුළුව) පැහැදිලිව හඳුනාගත යුතු අතර එම ලේඛනයේ ඇති වෙනත් තොරතුරුවලින් වෙන් කොට හඳුනාගත යුතුය. මීට අමතරව පහත සඳහන් තොරතුරු කැපී පෙනෙන අයුරු පෙනෙන්නට සැලැස්විය යුතු අතර ඉදිරිපත් කළ තොරතුරු තේරුම් ගැනීම අවශ්‍යකරන විට ඒවා නැවත නැවත ඉදිරිපත් කළ යුතුය.

(අ) වාර්තාකරනු ලබන අස්තිත්ත්වයේ නම සහ පූර්වගාමී වාර්තාකරනු ලැබූ කාලපරිච්ඡේදය අවසානයේ සිට නම වෙනස් කර ඇත්නම් එය;

(ආ) වාර්තාකරනු ලබන කාලපරිච්ඡේදයේ අවසාන දිනය සහ මූල්‍ය ප්‍රකාශන ආවරණය කරනු ලබන කාලපරිච්ඡේදය;

(ඇ) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලැබූ ව්‍යවහාර මුදල් වර්ගය; සහ

(ඈ) මූල්‍ය ප්‍රකාශන වල ඇති වටිනාකම් ඉදිරිපත්කර ඇත්තේ ව්‍යවහාර මුදල් ඒකක වල ගුණිත සංඛ්‍යා (රු. '000 වැනි) වශයෙන් නම් එය.

3.12 අස්තිත්ත්වයක් පහත සඳහන් දෑ සටහන් වල ඉදිරිපත් කළ යුතුයඃ

(අ) අස්තිත්ත්වයේ නෛතික ස්වරූපය, එය සංස්ථාපිත කළ රටේ නම, එහි ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය සහ ප්‍රධාන ව්‍යාපාරික කටයුතු කරන ස්ථානය; සහ

(ආ) අස්තිත්ත්වයේ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය සහ එහි ප්‍රධාන ක්‍රියාකාරකම් පිළිබඳ විස්තරයක්.

## වත්කම් සහ වගකීම් ප්‍රකාශනය

### හැඳින්වීම

3.13 වත්කම් සහ වගකීම් ප්‍රකාශනයේ වාර්තාකරනු ලබන දින අස්තිත්ත්වයේ වත්කම්, වගකීම් සහ ස්කන්ධය ඉදිරිපත් කළ යුතුය.

### ජංගම/ජංගම නොවන වෙන්කොට හඳුනාගැනීම

3.14 ජංගම සහ ජංගම නොවන වත්කම් සහ ජංගම සහ ජංගම නොවන වගකීම් වෙනම වර්ගීකරණයන් ලෙස එහි වත්කම් සහ වගකීම් ප්‍රකාශනයේ ඉදිරිපත් කළ යුතුය.

3.15 අස්තිත්ත්වයක් වත්කමක් ජංගම ලෙස වර්ගීකරණය කළ යුත්තේ පහත අවස්ථා වලදී ය:

(අ) අස්තිත්ත්වයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුලදී, වත්කම උපලබ්ධි කරගැනීමට අපේක්ෂාකරනවිට හෝ විකිණීමට හෝ පරිභෝජනය කිරීමට අදහස් කරනවිට;

(ආ) වත්කම රඳවා තබාගෙන ඇත්තේ මූලික වශයෙන් වෙළඳාම් කිරීමේ අරමුණ සඳහා වනවිට;

(ඇ) වාර්තාකරනු ලබන දිනෙන් පසුව මාස දොළහක කාලයක් ඇතුළතදී වත්කම උපලබ්ධි කරගැනීමට අපේක්ෂා කරනවිට;

(ඇ) වාර්තාකරනු ලබන දිනට පසුව අවම වශයෙන් මාස දොළහක කාලයක් සඳහා වගකීමක් නිරවුල් කිරීමට හුවමාරුකිරීම හෝ භාවිත කිරීම සීමා නොකර ඇත්තේ නම් හැර වත්කම් මුදල් හෝ ආසන්න මුදල් වනවිට,

3.16 අස්තිත්ත්වයක් වෙනත් සියලු වත්කම් ජංගම නොවන ලෙස වර්ගීකරණය කළ යුතුය. අස්තිත්ත්වයක සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය පැහැදිලිව හඳුනාගත නොහැකි කල්හි එහි කාලසීමාව මාස දොළහක් ලෙස උපකල්පනය කෙරේ.

3.17 අස්තිත්ත්වයක් වගකීමක් ජංගම ලෙස වර්ගීකරණය කළ යුත්තේ පහත අවස්ථා වලදී ය:

(අ) අස්තිත්ත්වයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළදී එය වගකීම නිරවුල් කිරීමට අපේක්ෂා කරනවිට;

(ආ) වාර්තාකරනු ලබන දිනෙන් පසුව මාස දොළහක් තුළදී වගකීම නිරවුල් කිරීමට නියමිතව ඇති විටෙකදී; හෝ

(ඇ) වාර්තාකරනු ලබන දිනෙන් පසුව අවම වශයෙන් මාස දොළහක කාලසීමාවක් සඳහා වගකීම නිරවුල් කිරීම විලම්භනය කිරීමට කොන්දේසි විරහිත අයිතියක් අස්තිත්ත්වයට නොමැති විටෙකදී

3.18 අස්තිත්ත්වයක් වෙනත් සියලු වගකීම් ජංගම-නොවන ලෙස වර්ගීකරණය කළ යුතුය.

## වත්කම් හා වගකීම් ප්‍රකාශනය තුළ හෝ සටහන් තුළ ඉදිරිපත් කළ යුතු තොරතුරු

3.19 අස්තිත්ත්වයක්, වත්කම් සහ වගකීම් ප්‍රකාශනය තුළ හෝ සටහන් තුළ ඉදිරිපත් කරන පේලි අයිතම්වල පහත සඳහන් උප වර්ගීකරණයන් හෙළිදරව් කළ යුතුය:

(අ) අස්තිත්ත්වයට උචිත පරිදි දේපළ, පිරියත සහ උපකරණවල වර්ගීකරණයන්;

(ආ) සම්බන්ධිත පාර්ශ්වයන්ගෙන් ලැබියයුතු වටිනාකම් සහ වෙනත් පාර්ශ්වවලින් ලැබිය යුතු වටිනාකම් වෙනම පෙන්වමින් වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ සහ මෙතෙක් බිල් නොකරන ලද උපචිත ආදායම් වලින් පැන නගින ලැබිය යුතු දෑ;

(ඇ) තොග වටිනාකම් වෙනම පෙන්වමින්, තොග:

(i) සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී විකිණීම සඳහා තබාගෙන ඇති (උදාහරණ වශයෙන්, සිල්ලර වෙළෙන්ඳන් තබාගෙන ඇති තොග සහ නිෂ්පාදකයෙක් තබාගෙන ඇති නිමි භාණ්ඩ);

(ii) එවන් විකුණුම් සඳහා නිෂ්පාදන ක්‍රියාවලියේ පවතින තොග (උදාහරණ වශයෙන් නිෂ්පාදකයෙකුගේ නොනිමි වැඩ);

(iii) නිෂ්පාදන ක්‍රියාවලිය තුළ හෝ සේවා සැපයීමේදී පරිභෝජනය සඳහා ද්‍රව්‍ය හෝ සැපයුම් ස්වරූපයෙන් තබාගෙන ඇති තොග (උදාහරණ වශයෙන් අමුද්‍රව්‍ය); සහ

(ඇ) වෙළඳ සැපයුම්කරුවන්ට ගෙවිය යුතු දෑ සහ සම්බන්ධිත පාර්ශ්වවලට ගෙවිය යුතු දෑ වෙනම පෙන්වමින් වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ, විලම්භිත ආදායම් සහ උපචිත වියදම්;

(ඉ) සේවක ප්‍රතිලාභ සඳහා ප්‍රතිපාදන සහ වෙනත් අයිතම් සඳහා ප්‍රතිපාදන වෙනම පෙන්වමින් ප්‍රතිපාදන; සහ

(ඊ) ප්‍රකාශිත ප්‍රාග්ධනය සහ රඳවාගත් ඉපයීම් වැනි ස්කන්ධයේ පන්ති.

3.20 කොටස් ප්‍රාග්ධනයක් සහිත අස්තිත්ත්වයක් පහත සඳහන් දේ වත්කම් සහ වගකීම් ප්‍රකාශනයේ හෝ සටහන්වල හෙළිදරව් කළ යුතුය:

(අ) එක් එක් කොටස් ප්‍රාග්ධන පන්තිය සඳහා;

(i) නිකුත් කළ කොටස් සහ සම්පූර්ණයෙන් ගෙවා නිමි කොටස් සංඛ්‍යාව සහ නිකුත් කළ එහෙත් සම්පූර්ණයෙන් ගෙවා නොනිමි කොටස් සංඛ්‍යාව;

(ii) කාලපරිච්ඡේදය ආරම්භයේ සහ අවසානයේදී හිඟව ඇති කොටස් සංඛ්‍යාවේ සැසඳීමක්;

(iii) ලාභාංශ බෙදාහැරීම මත සීමාවන් සහ ප්‍රාග්ධනය ආපසු ගෙවීම ඇතුළුව එම පන්තියට යාවූ හිමිකම්, වරණයන් සහ සීමා කිරීම්; සහ

(iv) කොන්දේසි සහ වටිනාකම් ඇතුළුව සහ විකල්ප සහ ගිවිසුම් යටතේ වෙන්කළ කොටස් සහ කොටස් විකිණීම සඳහා වන ගිවිසුම්;

(ආ) ස්කන්ධය තුළ එක් එක් සංචිතය පිළිබඳ විස්තරයක්.

## ලාභ හෝ අලාභ ගිණුම සහ රඳවාගත් ඉපයීම් ප්‍රකාශනය

3.21 වාර්තාකරන ලද කාලපරිච්ඡේදයේ ලාභ හෝ අලාභ නිර්ණය කිරීමේදී හඳුනාගත් ආදයම් සහ වියදම් අයිතම් වාර්තාකරන ලද කාලපරිච්ඡේදය ආරම්භයේ වූ රඳවාගත් ඉපයීම්, පූර්වකාල වැරදි නිවැරදි කිරීම්, පූර්ව කාලවලට සම්බන්ධිත ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්වල බලපෑම ගෙවූ ලාභාංශ රඳවාගත් ඉපයීම්වලට බලපාන වෙනත් ඕනෑම අයිතමයක් සහ වාර්තාකරන ලද කාලපරිච්ඡේදය අවසානයේ රඳවාගත් ඉපයීම් අස්තිත්ත්වයක් විසින්, වාර්තා කරන ලද කාලපරිච්ඡේදයේ ලාභ හෝ අලාභ සහ රඳවාගත් ඉපයීම ප්‍රකාශනයේ ඉදිරිපත් කළ යුතුය.

3.22 අස්තිත්ත්වය තුළ කාර්යය පදනම මත වියදම් වර්ගීකරණය භාවිත කර වියදම් පිළිබඳ විශ්ලේෂණයක් අස්තිත්ත්වයක් ඉදිරිපත් කළ යුතුය. කාර්යය පදනම මත සමාහරණය කළ වියදම් සඳහා උදාහරණ වනුයේ, විකුණුම් පිරිවැය, බෙදාහැරීම් පිරිවැය සහ පරිපාලන වියදම්ය, ආදායම් හෝ වියදම්වල ඕනෑම අයිතමයක් 'අතිවිශේෂ අයිතම්' ලෙස අස්තිත්ත්වය ඉදිරිපත් කිරීම හෝ විස්තර කිරීම නොකළ යුතුය.

## මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

### මුදල් හා සමාන දෑ

3.23 මුදල් හා සමාන දෑ වනුයේ කෙටිකාලීන මුදල් බැඳීම් නිරවුල් කිරීම සඳහා රඳවාගෙන ඇති කෙටි-කාලීන අතිශයින්ම ද්‍රවශීලී ආයෝජන වේ.එබැවින් ආයෝජනයක් සාමාන්‍යයෙන් මුදල් හා සමාන ලෙස සැලකීමට සුදුසුකම් ලබන්නේ එයට කෙටි පරිණත කාලයක් ඇතිවිටය. එනම් අත්පත් කරගත් දිනයේ සිට මාස තුනක් හෝ ඊට අඩුකාලයක් ඇති ආයෝජන. බැංකු අයිරාවක් සාමාන්‍යයෙන් සලකනු ලබන්නේ ණය ගැනීම්වලට සමාන මූල්‍ය ක්‍රියාකාරකම් ලෙසය.

### මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක ඉදිරිපත් කළ යුතු තොරතුරු

3.24 වාර්තාකරනු ලබන කාලපරිච්ඡේදය සඳහා ඉදිරිපත් කරන මුදල් ප්‍රවාහ මෙහෙයුම් ක්‍රියාකාරකම්, අයෝජන ක්‍රියාකාරකම් සහ මූල්‍ය ක්‍රියාකාරකම් ලෙස වර්ගීකරණය කර අස්තිත්ත්වයක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් ඉදිරිපත් කළ යුතුය.

### මෙහෙයුම් ක්‍රියාකාරකම්

3.25 මෙහෙයුම් ක්‍රියාකාරකම් වනුයේ අස්තිත්ත්වයේ ප්‍රධාන අයභාරය උත්පාදනය කරන ක්‍රියාකාරකම්ය. ඒ අනුව මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වන මුදල් ප්‍රවාහ සාමාන්‍යයෙන් හටගන්නේ ලාභ හෝ අලාභ නිර්ණය කිරීමේදී ඇතුලත්වන ගනුදෙනු සහ වෙනත් සිද්ධීන් සහ තත්ත්වයන් ගෙනි. නිෂ්පාදන අස්තිත්ත්වයක පිරියත අයිතමයක් විකිණීම වැනි සමහර ගනුදෙනු වලින් ලාභ හෝ අලාභවල ඇතුළත්වන ප්‍රතිලාභ හෝ අලාභයන් ඇතිවීමට හේතු විය හැකිය. කෙසේ වෙතත් එවැනි ගනුදෙනුවලට සම්බන්ධ මුදල් ප්‍රවාහ ආයෝජන ක්‍රියාකාරකම්වලින් වන මුදල් ප්‍රවාහය.

### ආයෝජන ක්‍රියාකාරකම්

3.26 ආයෝජන ක්‍රියාකාරකම් යනු මුදල් හා මුදල් හා සමාන දෑවල ඇතුළත් නොවන දිගුකාලීන වත්කම් සහ වෙනත් ආයෝජන අත්කර ගැනීම් සහ බැහැර කිරීම්ය.

### මුදල් යෙදවීම් ක්‍රියාකාරකම්

3.27 මුදල් යෙදවීම් ක්‍රියාකාරකම් යනු අස්තිත්ත්වයක දායක වූ ස්කන්ධය සහ ණය ගැනීම්වල විශාලත්වය සහ සංයුතිය වෙනස්වීම් හටගන්වන ක්‍රියාකාරකම්ය.

## මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වන මුදල් ප්‍රවාහ වාර්තාකරණය

3.28 අස්තිත්ත්වයක් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වන මුදල් ප්‍රවාහ වක්‍ර ක්‍රමය භාවිත කර ඉදිරිපත් කළ යුතුය. ඒ අනුව, මුදල් නොවන ගනුදෙනු අතීත හෝ අනාගත මෙහෙයුම් මුදල් ලැබීම් හෝ ගෙවීම්වල යම් විලම්භනය කිරීම් සහ උපචිතයන් සහ ආයෝජන හෝ මුදල් යෙදවීම් මුදල් ප්‍රවාහ ආශ්‍රිත ආදායම් හෝ වියදම් අයිතමයන්ගේ බලපෑමට ලාභ හෝ අලාභ ගලපනු ලැබේ.

3.29 මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය නිර්ණය කරනුයේ පහත සඳහන් දෑවල බලපෑම් සඳහා ලාභ හෝ අලාභ ගැලපීමෙනි:

(අ) කාලපරිච්ඡේදය තුළදී තොග සහ මෙහෙයුම් ලැබිය යුතු දෑ සහ ගෙවිය යුතු දෑ වල වෙනස්වීම්;

(ආ) මුදල්-නොවන අයිතම ක්ෂය කිරීම්, ප්‍රතිපාදන, මුදලින් මෙතෙක් නොලැබූ (හෝ ගෙවූ) උපචිත ආදායම් (හෝ වියදම්) සහ උපලබ්ධි නොවූ විදේශ ව්‍යවහාර මුදල් ප්‍රතිලාභ හෝ අලාභයන්; සහ

(ඇ) මුදල් බලපෑම සම්බන්ධිත ආයෝජන හෝ මුදල් යෙදවීම් සියලු වෙනත් අයිතම.

## සටහන්

3.30 සටහන්වල:

(අ) මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ පදනම සහ භාවිත කල නිශ්චිතව ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳව තොරතුරු ඉදිරිපත් කිරීම;

(ආ) මූල්‍ය ප්‍රකාශනවල අන් තැනක ඉදිරිපත් කර නොමැති මෙම ප්‍රමිතයෙන් අවශ්‍යකරණ තොරතුරු හෙළිදරව් කිරීම; සහ

(ඇ) මූල්‍ය ප්‍රකාශන වල අන්තැනක ඉදිරිපත් කර නොමැති එහෙත් යම් දෙයක් අවබෝධ කරගැනීමට අදාළ තොරතුරු ලබාදීම.

3.31 ප්‍රායෝගික වනතාක් දුරට සටහන් ක්‍රමවත් ආකාරයකට අස්තිත්ත්වයක් ඉදිරිපත් කළ යුතුය. සටහන් වල ඇති යම් සම්බන්ධිත තොරතුරකට අදාළ මූල්‍ය ප්‍රකාශනවල ඇති එක් එක් අයිතමය සඳහා හරස් යොමුවක් අස්තිත්ත්වය දිය යුතුය.

3.32 සටහන් ඉදිරිපත්කිරීම සඳහා ක්‍රමවත් අනුපිළිවෙළ පිළිබඳ උදාහරණ පහත දක්වේ.

(අ) *කුඩා අස්තිත්ත්ව සඳහා වන SLFRS* වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බවට ප්‍රකාශනයක්;

(ආ) ව්‍යවහාර කළ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක්;

(ඇ) ඉදිරිපත් කළ එක් එක් ප්‍රකාශනයේ සහ එක් එක් පේළි අයිතමයේ අනුපිළිවෙළ අනුව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති අයිතම සඳහා තහවුරු කිරීමේ තොරතුරු; සහ

(ඈ) වෙනත් යම් හෙළිදරව් කිරීම්.

### ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම

3.33 වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්තිවල සාරාංශයේ පහත සඳහන් තොරතුරු අස්තිත්ත්වයක් හෙළිදරව් කළ යුතුය:

(අ) මූල්‍ය වාර්තා පිළියෙළ කිරීමේදී භාවිත කළ (උදාහරණ වශයෙන්, ඓතිහාසික පිරිවැය) මිනුම්කරන පදනම (පදනම්); සහ

(ආ) මූල්‍ය ප්‍රකාශන අවබෝධ කරගැනීමට අදාළ භාවිත කළ වෙනත් ගිණුම්කරණ ප්‍රතිපත්ති.

## ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ ව්‍යවහාරකරණය

4.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති යනු මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී අස්තිත්ත්වයක් ව්‍යවහාරකරණ නිශ්චිත මූලධර්ම, පදනම්, පොදු සම්මතයන්, රීතීන්, සහ පරිචයන් වේ. එක හා සමාන ගනුදෙනු සඳහා අස්තිත්ත්වයක් එහි ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගෙන සංගතව ව්‍යවහාර කළ යුතුය.

## ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

4.2 අස්තිත්ත්වයක් විසින් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් වෙනස්කළ යුත්තේ එම වෙනස් කිරීම මගින්, ගනුදෙනුවල බලපෑම, වෙනත් සිද්ධීන් සහ අස්තිත්ත්වයේ මූල්‍ය තත්ත්වයේ ස්වභාවය හෝ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳව මූල්‍ය ප්‍රකාශන තුළින් විශ්වාසදායක සහ වඩාත් අදාළ තොරතුරු ලබාදීම ප්‍රතිඵලයක් වන්නේ නම් පමණි. එබැවින් ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කිරීම සාමාන්‍යයෙන් විරලය.

4.3 ගනුදෙනු සඳහා නව ගිණුම්කරණ ප්‍රතිපත්තියක් ව්‍යවහාරකිරීම, මෙයට පෙර සිදුනොවූ හෝ ප්‍රමාණාත්මක නොවන වෙනත් සිද්ධියක් හෝ තත්ත්වයන් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් වෙනස්වීම් ලෙස සලකනු නොලැබේ.

### ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීම් ව්‍යවහාරකරණය

4.4 පූර්ව කාලපරිච්ඡේදයකට සම්බන්ධිත ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීමේ බලපෑම අස්තිත්ත්වයක් විසින් ප්‍රවර්තන වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදයේදී ලාභය නිර්ණය කිරීමේදී හඳුනා නොගත් අයිතමයක් ලෙස, එහෙත් ඉදිරියට ගෙනආ රඳවාගත් ඉපයීම් නිර්ණය කිරීමේදී හඳුනාගත් අයිතමයක් ලෙස ලාභ හෝ අලාභ සහ රඳවාගත් ඉපයීම් ප්‍රකාශනයේ අස්තිත්ත්වය ඉදිරිපත් කළ යුතුය.

## ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම්

4.5 ගිණුම්කරණ ඇස්තමේන්තුවක් වෙනස් කිරීම යනු වත්කම් හා වගකීම් ආශ්‍රිතව අපේක්ෂිත අනාගත ප්‍රතිලාභ සහ බැඳීම් සහ ප්‍රවර්තන තත්ත්වය තක්සේරු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස වත්කමක හෝ වගකීමක ධාරණ අගය හෝ වත්කමක වාරිකව පරිභෝජනය ගැලපීමය. නව තොරතුරු හෝ අලුතෙන් මතුවන තත්ත්වයන්ගෙන් ප්‍රතිඵලයක් වන ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් ඒ අනුව වැරදි නිවැරදි කිරීම නොවේ. ගිණුම්කරණ ප්‍රතිපත්තියක් ගිණුම්කරණ ඇස්තමේන්තුවකින් වෙන් කොට හඳුනාගැනීම අපහසුවනවිට, වෙනස්වීම් ගිණුම්කරණ ඇස්තමේන්තුවක් වෙනස්කිරීමක් ලෙස සලකනු ලැබේ.

4.6 ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනස්වීම් වල උදාහරණවලට ඇතුළත් වන්නේ,

(අ) වත්කමක ප්‍රතිලාභ පරිභෝජනය කිරීමේ රටාවේ සංශෝධිත තක්සේරු කිරීම පිළිබිඹු වීමට, දේපළ, පිරියත සහ උපකරණ ක්ෂය කිරීමේ ක්‍රමය හීනවන ශේෂ ක්‍රමයෙන් සරල මාර්ගික ක්‍රමයට වෙනස් කිරීම; සහ

(ආ) දේපොළ, පිරියත සහ උපකරණ අයිතමයක ප්‍රයෝජ්‍ය ජීවකාලය යළි ඇස්තමේන්තු කිරීම.

4.7 ගිණුම්කරණ ඇස්තමේන්තුවක් වෙනස් කිරීමේ බලපෑම, එය අනාගතයට බලපාන පරිදි ලාභ හෝ අලාභ වල ඇතුළත් කිරීම මගින් අස්තිත්ත්වයක් හඳුනාගත යුතුය.

(අ) වෙනස්වීම් බලපාන්නේ එම කාලපරිච්ඡේදයට පමණක් නම්, වෙනස්වීම් සිදුවූ කාලපරිච්ඡේදය; හෝ

(ආ) වෙනස්වීම කාලපරිච්ඡේද දෙකටම බලපාන්නේ නම් වෙනස්වීම සිදුවූ කාලපරිච්ඡේදය සහ අනාගත කාලපරිච්ඡේද.

4.8 ගිණුම්කරණ ඇස්තමේන්තුවක් වෙනස්වීමෙන් හටගන්නා වත්කම් හෝ වගකීම්වල වෙනස්වීමේ ප්‍රමාණයට, වෙනස්වීම සිදුවූ කාලපරිච්ඡේදයේ සම්බන්ධිත වත්කමේ හෝ වගකීමේ ධාරණ අගය ගැලපීමෙන් අස්තිත්ත්වයක් එම වෙනස්වීමේ ප්‍රමාණය හඳුනාගත යුතුය.

## පූර්ව කාලපරිච්ඡේද වැරදි නිවැරදි කිරීම

4.9 පූර්ව කාල වැරදි යනු පහත වන විශ්වාසදායක තොරතුරු භාවිත කිරීමට අපොහොසත්වීම හෝ අවභාවිතයෙන් පැන නැගුන, අස්තිත්ත්වයේ එකක් හෝ ඊට වැඩි පූර්ව කාලපරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශන තුල කරන ලද අත්හැරීම් සහ අවප්‍රකාශනයන් වේ.

(අ) එම කාලපරිච්ඡේද සඳහා මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට අනුමැතිය දෙන අවස්ථාවේ ලබාගත හැකිව තිබූ තොරතුරු; සහ

(ආ) එම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී සහ ඉදිරිපත් කරන අවස්ථාවේදී සාධාරණ ලෙස ලබාගැනීමට අපේක්ෂා කළ හැකිව තිබූ සහ ගිණුම්ගත කළ යුතුව තිබූ තොරතුරු.

4.10 ගණිතමය වැරදි, ගිණුම්කරණ ප්‍රතිපත්ති ව්‍යවහාර කිරීමේදී වන වැරදි අමතකවී යාම් හෝ කරුණු වැරදි අර්ථනිරූපණය සහ වංචාවල බලපෑම් එවැනි වැරදි වලට ඇතුළත්ය.

4.11 පූර්වකාල වලට සම්බන්ධිත වැරදි වල බලපෑම, වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදයේ ලාභය හෝ අලාභය නිර්ණය කිරීමේදී හඳුනා නොගත් අයිතමයක් ලෙස ලාභ හෝ අලාභ සහ රඳවාගත් ඉපයීම් ප්‍රකාශන වල ඉදිරිපත් කළ යුතු අතර එය ඉදිරියට ගෙන ආ රඳවාගත් ඉපයීම් නිර්ණය කිරීමේදී හඳුනාගත යුතුය.

## හෙළිදරව් කිරීම

### ගිණුම්කරණ ප්‍රතිපත්තියක් වෙනස්වීම් හෙළිදරව් කිරීම

4.12 ගිණුම්කරණ ප්‍රතිපත්තියක වෙනස්වීම ප්‍රවර්තන කාලපරිච්ඡේදය හෝ යම් පූර්ව කාලපරිච්ඡේදයක් මත බලපාන්නේ නම් පහත සඳහන් දෑ අස්තිත්ත්වයක් හෙළිදරව් කළ යුතුය:

(අ) ගිණුම්කරණ ප්‍රතිපත්තිය වෙනස්වීමේ ස්වභාවය;

(ආ) නව ගිණුම්කරණ ප්‍රතිපත්තිය ව්‍යවහාර කිරීමෙන් විශ්වාසදායක සහ වඩාත් අදාළ තොරතුරු ලබාදීමට හේතු මොනවාද? යන්න;

(ඇ) ලාභ හෝ අලාභ සඳහා වන ගැලපුම් වල වටිනාකම පහත දැට ප්‍රායෝගික වන ප්‍රමාණය;

(i) ප්‍රවර්තන කාලපරිච්ඡේදය සඳහා; සහ

(ii) ප්‍රවර්තන කාලපරිච්ඡේදයට පෙර කාලපරිච්ඡේද සඳහා සමාහරණය කළ ප්‍රමාණය; සහ

(ඈ) ඉහත (ඇ) හි වටිනාකම් හෙළිදරව් කිරීම නිර්ණය කිරීම ප්‍රායෝගික නොවන්නේ නම් එයට හේතු

පසුව වන කාලපරිච්ඡේද සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල මෙම හෙළිදරව් කිරීම නැවත නැවත ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

### ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනස්වීම හෙළිදරව් කිරීම

4.13 යම් ගිණුම්කරන ඇස්තමේන්තුවක වෙනස්වීමේ ස්වභාවය සහ ඒ වෙනස්වීම මත වත්කම්, වගකීම, ආදායම් සහ වියදම් වලට ප්‍රවර්තන කාලපරිච්ඡේදයේදී වන බලපෑම අස්තිත්ත්වය විසින් හෙළිදරව් කළ යුතුය.

### පූර්ව කාලපරිච්ඡේදවල වැරදි හෙළිදරව් කිරීම

4.14 පූර්ව කාලවැරදි පිළිබඳව පහත දෑ අස්තිත්ත්වයක් විසින් හෙළිදරව් කළ යුතුය:

(අ) පූර්ව කාලපරිච්ඡේදයේ වැරැද්දේ ස්වභාවය;

(ආ) රඳවාගත් ඉපයීම්වලට කරන ලද නිවැරදි කිරීම්වල වටිනාකම;

(ඇ) ඉහත සඳහන් (අ) සහ (ආ) හි වන වටිනාකම් නිර්ණය කිරීම ප්‍රායෝගික නොවන්නේ නම් එයට හේතු;

පසුව වන කාලපරිච්ඡේද සඳහාවන මූල්‍ය ප්‍රකාශනවල මෙම හෙළිදරව් කිරීම නැවත නැවත ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

## *5 වන පරිච්ඡේදය - තොග*

### විෂය පථය

5.1 තොග යනු:

(අ) ව්‍යාපාරවල සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු තුළදී තබා ගෙන ඇති;

(ආ) එවැනි විකුණුම් සඳහා නිෂ්පාදන ක්‍රියාවලියේ පවතින;

(ඇ) නිෂ්පාදන ක්‍රියාවලියේදී හෝ සේවා සැපයීමේදී පරිභෝජනය කිරීම් සඳහා ද්‍රව්‍ය හෝ සැපයුම් ස්වරූපයෙන් ඇති වත්කම් වේ.

### තොග මිණුම්කරණය

5.2 අස්තිත්ත්වයක් විසින් තොග මැනිය යුත්තේ පිරිවැයට හෝ ඇස්තමේන්තු කළ විකුණුම් මිලෙන් ඒවා නිම කිරීමට සහ විකිණීමට යන වියදම් අඩු කිරීමෙන් යන වටිනාකම් වලින් අඩු වටිනාකමයි.

**තොග පිරිවැය**

5.3 මිලට ගත් පිරිවැය, පරිවර්ත්‍ය පිරිවැය සහ තොගය වර්තමාන තිබෙන ස්ථානයට සහ තත්ත්වයට ගෙනඒමේදී දරන වෙනත් පිරිවැය අස්තිත්ත්වයක් තොගවල පිරිවැයට ඇතුළත් කළ යුතුය.

**මිලදී ගැනීමේ පිරිවැය**

5.4 මිලදීගත් මිල ආනයන බදු සහ වෙනත් බදු (බදුකරන අධිකාරීන්ගෙන් අස්තිත්ත්වයට පසුව ආපසු අයකරගත හැකි බදු හැර) සහ ප්‍රවාහන සහ මෙහෙයුම් සහ නිමි භාණ්ඩ ද්‍රව්‍ය හෝ හෝ සේවා අත්කර ගැනීමේදී ඍජුව ආරෝපණය වන වෙනත් පිරිවැය තොග මිලට ගත් පිරිවැයේ අන්තර්ගත වේ. වෙළඳ වට්ටම් ප්‍රතිදාන සහ වෙනත් ඒ හා සමාන අයිතම් මිලදී ගැනීමේ පිරිවැය නිර්ණය කිරීමේදී අඩුකරනු ලැබේ.

**පරිවර්ත්‍ය පිරිවැය**

5.5 නිෂ්පාදනය කළ ඒකක සංඛ්‍යාවට ඍජුව සම්බන්ධිත ඍජු ද්‍රව්‍ය සහ ඍජු ශ්‍රමය වැනි පිරිවැය පමණක් තොග පරිවත්‍ය කිරීමේ පිරිවැයට ඇතුළත් වේ.

**බද්ධ නිෂ්පාදන සහ අතුරු - නිෂ්පාදන**

5.6 නිෂ්පාදන ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස එකවර එක නිෂ්පාදනයකට වඩා වැඩි නිෂ්පාදන නිෂ්පාදනය කිරීමක් සිදුවිය හැකිය. උදාහරණයක් වශයෙන් මේ සඳහා අවස්ථාව වනුයේ බද්ධව නිෂ්පාදනය වීම හෝ ප්‍රධාන නිෂ්පාදනය සහ අතුරු නිෂ්පාදන නිෂ්පාදනය වීමයි. එක් එක් නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය පිරිවැය හෝ පරිවර්ත්‍ය පිරිවැය වෙන වෙනම හඳුනාගත නොහැකි කල්හි අස්තිත්ත්වයක් විසින් එම පිරිවැය තර්කාන්විත සහ සංගත පදනමක් මත නිෂ්පාදන අතර වෙන්කළ යුතුය. උදාහරණ වශයෙන් නිෂ්පාදන ක්‍රියාවලියේ එක්කෝ නිෂ්පාදන වෙන් කොට හඳුනාගත හැකි අදියරේදී හෝ නිෂ්පාදනය සම්පූර්ණ වන අවස්ථාවේ සාපේක්ෂ විකුණුම් වටිනාකම පදනම මත වෙන් කිරීම කළ හැකිය. අතුරු නිෂ්පාදනයක පිරිවැය ප්‍රමාණවත් නොවන විට අස්තිත්ත්වයක් එහි වටිනාකම මැනිය යුත්තේ අතුරු නිෂ්පාදනවල විකුණුම් මිලෙන්, එම නිෂ්පාදනය සම්පූර්ණ කිරීමට හෝ විකිණීමට යන වියදම් අඩුකර ලැබෙන වටිනාකම ප්‍රධාන නිෂ්පාදනයේ පිරිවැයෙන් අඩු කිරීමෙනි.

**තොගවල ඇතුළත් නොකළ යුතු පිරිවැය**

5.7 තොග පිරිවැයේ ඇතුළත් නොකළ යුතු සහ ඒවා දරන ලද කාලපරිච්ඡේදයේදී වියදම් ලෙස හඳුනාගත යුතු පිරිවැයට උදාහරණ වන්නේ:

(අ) අසාමාන්‍ය ලෙස වූ අපතේ යන ද්‍රව්‍ය, ශ්‍රමය සහ වෙනත් නිෂ්පාදන පිරිවැයේ වටිනාකම්;

(ආ) නිෂ්පාදන අදියරවල් අතර ගබඩා කිරීම අවශ්‍යවන්නේ නම් හැර ගබඩා කිරීමේ පිරිවැය;

(ඇ) නිෂ්පාදන සහ පරිපාලන පොදුකාර්ය;

(ඈ) විකුණුම් පිරිවැය;

(ඉ) පොලී පිරිවැය; සහ

(ඊ) විදේශ විනිමය වෙනස්වීම්

## සේවා සපයන්නෙකුගේ තොග පිරිවැය

5.8 සේවා සපයන්නෙක් සතු තොග මනිනුයේ එම තොගවල නිෂ්පාදන පිරිවැයටය. ප්‍රධාන වශයෙන් නිෂ්පාදන පිරිවැය සමන්විතවන්නේ අධීක්ෂණ පිරිස් ද ඇතුළුව සේවා සැපයීමේදී ඍජුව නියැලී සිටින පිරිස් වල පිරිවැයෙනි. විකුණුම් සහ සාමාන්‍ය පරිපාලන කටයුතුවල නියැලී ඇති පිරිස් වල පිරිවැය ඇතුළත් නොවන අතර ඒවා දරන ලද කාලපරිච්ඡේදයේ වියදමක් ලෙස හඳුනා ගැනේ. සේවා සපයන්නකුගේ තොග පිරිවැයෙහි ලාභ ආන්තික හෝ ආරෝපිත නොවන පොදුකාර්ය ඇතුළත් නොවේ.

## ප්‍රමිත පිරිවැයකරණය, සිල්ලර ක්‍රමය සහ වඩාත් මෑතක මිලදීගත් මිල වැනි පිරිවැය මිනුම්කරණය සඳහාවන ශිල්ප ක්‍රම

5.9 ප්‍රතිඵලය සත්‍ය පිරිවැයට ආසන්න වන්නේ නම් අස්තිත්ත්වයක්, තොග පිරිවැය මැනීම සඳහා ප්‍රමිත පිරිවැය ක්‍රමය, ආන්තික අඩුකළ සිල්ලර මිල හෝ ඉතා මෑතක මිලදී ගත් මිල වැනි ශිල්ප ක්‍රම භාවිත කළ හැකිය. සාමාන්‍ය මට්ටම්වල ද්‍රව්‍ය සහ සැපයුම් ශ්‍රමය කාර්යක්ෂමතාවය සහ ධාරිතා උපයෝජනය ප්‍රමිත පිරිවැයේදී ගණන් ගනු ලැබේ. ඒවා විධිමත්ව සමාලෝචනය කරන අතර අවශ්‍ය වන්නේ නම් වර්තමාන තත්ත්වයන් පදනම අනුව ප්‍රතිශෝධනය කෙරේ.

## පිරිවැය දැන ගැනීමේ ක්‍රම

5.10 සාමාන්‍යයෙන් හුවමාරු කරගත නොහැකි සහ නිෂ්පාදනය කළ භාණ්ඩ හෝ සේවා සහ ඒවායේ තනි තනි පිරිවැය නිශ්චිත හඳුනාගැනීමක් භාවිත කරමින් නිශ්චිත ව්‍යාපෘති වලට වෙන්කළ පිරිවැය අයිතම් වල පිරිවැය අස්තිත්ත්වය මැනිය යුතුය.

5.11 මුලින් පිවිසි මුලින් නිකුතු (FIFO) හෝ බර තැබූ සාමාන්‍ය පිරිවැය ක්‍රමය භාවිත කර තොග පිරිවැය අස්තිත්ත්වයක් මැනිය යුතුය. ඒ හා සමාන ස්වභාවයක් සහ භාවිතයක් ඇති සියලුම තොග සඳහා එම ක්‍රමයම භාවිත කළ යුතුය. වෙනත් ස්වභාවයේ සහ භාවිතයක් ඇති තොග සඳහා වෙනත් ක්‍රමයක් භාවිත කිරීම සාධාරණීයකරණය කළ හැකිය. අන්තිමට නිකුතු මුලින් පිවිසි (LIFO) සඳහා අවසර නොදේ.

## වියදමක් ලෙස හඳුනාගැනීම

5.12 තොග විකුණූවිට සම්බන්ධිත අයභාරය හඳුනාගත් කාලපරිච්ඡේදයේදී එම තොගවල ධාරන වටිනාකම (විකුණූ බඩුවල පිරිවැය ලෙස නිතර හඳුන්වනු ලබන) අස්තිත්ත්වයක් වියදමක් ලෙස හඳුනාගත යුතුය.

5.13 සමහර තොග වෙනත් වත්කම් ගිණුම්වලට වෙන් කළ හැකිය; උදාහරණ වශයෙන් අස්තිත්ත්වය විසින් තනන ලද දේපළ පිරියත හෝ උපකරණ මේ ආකාරයට වෙනත් වත්කම් වලට වෙන්කරන ලද තොග එම වර්ගයේ වත්කමට අදාළ මෙම ප්‍රමිතයේ පසුව වන පරිච්ඡේදය අනුව ගිණුම්ගත කෙරේ.

## හෙළිදරව් කිරීම

5.14 පහත සඳහන් දෑ අස්තිත්ත්වයක් හෙළිදරව් කළ යුතුය.

(අ) භාවිත කළ ක්‍රමය ඇතුළුව තොග මැනීම සඳහා තෝරාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති;

(ආ) තොග වල ධාරන වටිනාකමේ එකතුව සහ අස්තිත්ත්වයට උචිත වර්ගීකරණ අනුව ධාරණ වටිනාකම;

(ඇ) කාලපරිච්ඡේදය තුලදී වියදම් ලෙස හඳුනාගත් තොගවල වටිනාකම;

(ඈ) ලාභ හෝ අලාභවල හඳුනාගත් හෝ ප්‍රතිවර්තා කළ හානිකරණ අලාභ; සහ

(ඉ) වගකීම් සඳහා ඇප ලෙස ඔඩපනය කළ තොගවල ධාරන වටිනාකමේ එකතුව.

## *6 වන පරිච්ඡේදය - දේපළ, පිරියත සහ උපකරණ*

## විෂය පථය

6.1 දේපළ පිරියත සහ උපකරණ වනුයේ:

(අ) භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනය හෝ සැපයීම සඳහා භාවිතා කිරීමට වෙනත් අයට කුලියට දීමට හෝ පරිපාලන අරමුණු සඳහා තබා ගෙන ඇති; සහ

(ආ) එක වාර්තාකරනු ලබන කාලපරිච්ඡේදයකට වඩා වැඩි කාලපරිච්ඡේදයක් තුළ භාවිත කිරීම අපේක්ෂා කරන අස්පෘශ්‍ය වත්කම්ය.

## හඳුනාගැනීම

6.2 අස්තිත්ත්වය එම අයිතම එක කාලපරිච්ඡේදයකට වඩා භාවිත කිරීමට අපේක්ෂා කරන්නේ නම් හෝ දේපළ, පිරියත හෝ උපකරණ හා පමණක් සම්බන්ධය වන්නේ නම් අමතර කොටස්, සූදානමෙන් තබාගෙන ඇති උපකරණ, සේවා කරන උපකරණ වැනි අයිතම, දේපළ, පිරියත සහ උපකරණ වන්නේය. එසේ නොමැති නම්, එවැනි අයිතම් තොග ලෙස වර්ගීකරණය කෙරේ.

ඉඩම් සහ ගොඩගැනිලි වෙන් කළ හැකි වත්කම්ය. ඒවා අත්පත් කරගන්නේ එකට වූයේ වුවද අස්තිත්ත්වය ඒවා වෙනම ගිණුම් ගත කළ යුතුය.

## හඳුනා ගැනීමේදී මැනීම

6.3 දේපළක්, පිරියත සහ උපකරණ අයිතමයක් මූලික හඳුනාගැනීමේදී අස්තිත්ත්වයක් මැනිය යුත්තේ ඒවායේ පිරිවැයටය.

## පිරිවැයේ මූලිකාංග

6.4 පිරිවැය, දේපළ සහ උපකරණ අයිතමයක පිරිවැය පහත සඳහන් සියලුම දැවලින් සමන්විත වේ:

(අ) වෙළඳ වට්ටම් සහ ප්‍රතිදාන අඩුකිරීමෙන් පසු නීති සහ තැරැව්කරු ගාස්තු, ආනයන බදු, ආපසු නොගෙවන මිලදීගැනීම් බදු ඇතුළුව එහි මිලට ගැනුම් පිරිවැය; සහ

(ආ) කලමනාකාරිත්වය අපේක්ෂා කරන ආකාරයට එය මෙහෙයවීමට හැකි ආකාරය සඳහා වත්කම අවශ්‍යකරන ස්ථානයට හෝ තත්ත්වයට ගෙනඒම සඳහා අවශ්‍ය ඍජුව ආරෝපණය වන යම් පිරිවැයක්.

6.5 පහත සඳහන් පිරිවැය දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක පිරිවැය නොවන අතර ඒවා දරනු ලබන අවස්ථාවේ පිරිවැයක් ලෙස අස්තිත්ත්වය හඳුනාගත යුතුය:

(අ) නව පහසුකමක් විවෘත කිරීමේ පිරිවැය;

(ආ) නව නිෂ්පාදනයක් හෝ සේවාවක් හඳුන්වාදීමේ පිරිවැය (ප්‍රචාරණය සහ ප්‍රවර්ධන පිරිවැය ඇතුළුව);

(ඇ) නව ස්ථානයක හෝ නව ගනුදෙනුකාර පන්තියක් සඳහා ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේ වියදම් (සේවකයන් පුහුණු කිරීම ඇතුළුව);

(ඈ) පරිපාලන සහ සාමාන්‍ය පොදුකාර්ය පිරිවැය; සහ

(ඉ) ණයගැනීම් පිරිවැය

6.6 දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක් තැනීමේ හෝ සංවර්ධනය තුළදී වන ආදායම් සහ ආනුශංගික මෙහෙයුම් වලට සම්බන්ධිත වියදම්, එවැනි මෙහෙයුම් අපේක්ෂා කරන ස්ථානයට හේ මෙහෙයුම් තත්ත්වයට අයිතමය පත් කිරීමට අව්‍ය නොවන්නේ නම් ඒවා ලාභ හෝ අලාභවල හඳුනාගනු ලැබේ.

## මූලික හඳුනා ගැනීමෙන් පසු මිනුම්කරණය

6.7 දේපළ, පිරියත සහ උපකරණ අයිතමයන් මූලික හඳුනාගැනීමෙන් පසු අස්තිත්ත්වයක් මැනිය යුත්තේ පසුව සිදුවූ යම් සමුච්චිත ක්ෂය කිරීමක් සහ යම් සමුච්චිත හානිකරණ අලාභයන් පිරිවැයෙන් අඩු කළ පසුවය.

6.8 දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක පිරිවැයෙන් සමුච්චිත ක්ෂය කිරීම අඩුකිරීමෙන් පසුව වන අදාළ පිරිවැය කොටසෙහි සාමාන්‍ය භාවිතය නිසා හැර සිදුවූ හානියක්, ලාභ හෝ අලාභවල හානිකරණයක් ලෙස හඳුනාගත යුතුය. දේපළ පිරියත සහ උපකරණ අයිතමයක දෛනිකව සිදුවන සේවාකරණ පිරිවැය එම පිරිවැය දරනු ලබන කාලපරිච්ඡේදයේදී හඳුනාගත යුතුය.

## ක්ෂය කළ හැකි වටිනාකම සහ ක්ෂය කිරීමේ කාලපරිච්ඡේදය

6.9 වත්කමක ක්ෂය කළ යුතු වටිනාකම ක්‍රමවත් පදනමක් මත එහි ප්‍රයෝජ්‍ය ජීව කාලය පුරා අස්තිත්ත්වය වෙන් කළ යුතුය. පිරිවැයෙන්, සමුච්චිත ක්ෂය කිරීම සහ සමුච්චිත හානිකරන අලාභ සහ අවශේෂ අගය අඩු කිරීමෙන් පසුව වන අගය ක්ෂය කළ යුතු වටිනාකමයි. වත්කම දැනටමත් එහි නියමිත කාලයට පැමිණ ඇත්නම් සහ එහි ප්‍රයෝජ්‍ය ජීවිත කාලය අවසානයේදී අපේක්ෂා කරන කරන තත්ත්වයට පැමිණ ඇතිවිටක බැහැර කිරීමට වන අපේක්ෂිත පිවැය අඩු කිරීමෙන් පසු, වත්කම බැහැර කිරීමෙන්

වර්තමානයේදී අස්තිත්ත්වය ලබාගත හැකිවිය හැකි ඇස්තමේන්තුගත වටිනාකම එහි අවශේෂ අගයවේ.

6.10 එක් එක් කාලපරිච්ඡේදය සඳහා වන ක්ෂය කිරීමේ වටිනාකම ලාභ හෝ අලාභවල හඳුනා ගැනේ.

6.11 වත්කම භාවිත කරන ආකාරයේ වෙනස්වීම්, අනපේක්ෂිත වැහැරීම සහ ගෙවීයාම් තාක්ෂණික දියුණුව සහ වෙළඳපොළ මිල ගණන් වැනි සාධක වඩාත් මෑත වාර්ෂික වාර්තාකරන දින සිට වත්කමේ අවශේෂ අගය හෝ ප්‍රයෝජ්‍ය ජීව කාලය වෙනස් වී ඇති බවට ඉඟි කළ හැකිය. එවැනි සාධක පවතී නම් අස්තිත්ත්වයක් කලින්කල ඇස්තමේන්තු සමාලෝචනය කළයුතු අතර, වර්තමාන අපේක්ෂාවන් වෙනස් නම් අවශේෂ අගය ක්ෂය කිරීමේ ක්‍රමය හෝ ප්‍රයෝජ්‍ය ජීව කාලය සංශෝධනය කළ යුතුය. අවශේෂ අගය, ක්ෂය කිරීමේ ක්‍රමය හෝ ප්‍රයෝජ්‍ය ජීව කාලයේ වෙනස්වීම සඳහා අස්තිත්ත්වය ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනසක් ලෙස ගිණුම්ගත කළ යුතුය.

6.12 වත්කමක් ක්ෂය කිරීම ආරම්භවන්නේ එය භාවිතා කිරීම සඳහා ලබාගත හැකි වන අවස්ථාවේ සිටය. එනම් කලමනාකාරිත්වය අපේක්ෂා කරන ආකාරයට එය මෙහෙයුම් කිරීම හැකිවීම සඳහා අවශ්‍ය කරන තත්ත්වයන් සහ එය සුදුසු ස්ථානයේ තිබෙන විටය. වත්කමක් ප්‍රතිහඳුනා ගත්විට හෝ සම්පූර්ණයෙන් ක්ෂය කළවිට වත්කම ක්ෂය කිරීම නවතී.

6.13 වත්කමක ප්‍රයෝජ්‍ය ජීව කාලය යනු අස්තිත්ත්වයට වත්කමක් භාවිත කිරීම සඳහා ලබාගත හැකි කාලපරිච්ඡේදය හෝ වත්කම ලබාගත හැකි කාලපරිච්ඡේදය පුරා අස්තිත්ත්වය විසින් අපේක්ෂා කරන නිෂ්පාදන සංඛ්‍යාව හෝ ඒ හා සමාන අපේක්ෂිත ඒකක සංඛ්‍යාව වේ. වත්කමක ප්‍රයෝජ්‍ය ජීව කාලය නිර්ණය කිරීමේදී පහත සඳහන් සියලුම කරුණු අස්තිත්ත්වයක් විසින් සැලකිල්ලට ගත යුතුය:

(අ) වත්කමේ අපේක්ෂිත භාවිතය. භාවිතය තක්සේරු කරන්නේ වත්කමේ අපේක්ෂිත ධාරිතාවය හෝ භෞතික නිමවුමට යොමු කරමිනි;

(ආ) අපේක්ෂිත වැහැරීමේ සහ ගෙවීයාම්, මෙය රඳා පවත්නේ වත්කම භාවිත කිරීමට අපේක්ෂා කරන සේවා මුර ගණන සහ අලුත්වැඩියා සහ නඩත්තු කිරීමේ නිශ්චිත සැලසුම් සහ වත්කම අක්‍රියව පවතිනවිට සත්කාර කිරීම සහ නඩත්තුව වැනි මෙහෙයුම් සාධක මතය;

(ඇ) තාක්ෂණික හා වාණිජ යල්පැනීම පැන නගිනුයේ නිෂ්පාදනයේ වෙනස්වීම් හෝ වැඩිදියුණු කිරීම් හෝ වත්කමේ නිෂ්පාදන හෝ සේවා නිමවුමේ සඳහා ඇති වෙළඳපොළ ඉල්ලුමේ වන වෙනස්වීම් වලින්; සහ

(ඈ) සම්බන්ධිත කල්බදු කාලසීමා අවසානවීම වැනි වත්කම භාවිත කිරීම මත වන නෛතික හෝ ඒ හා සමාන සීමාවන් ව්‍යතිරේඛයක් වශයෙන් ගල්වලවල් සහ ඉඩම් ගොඩකිරීම සඳහා වන වැඩබිම්, අසීමිත ජීවකාලයක් ඇති ඉඩම් එබැවින් ක්ෂය නොකරනු ඇත.

## ක්ෂය කිරීමේ ක්‍රමය

6.14 වත්කමක අනාගත ප්‍රතිලාභ පරිභෝජනය කිරීමට එය අපේක්ෂා කරන රටාව පිළිබිඹු වන ක්ෂය කිරීමේ ක්‍රමයක් අස්තිත්ත්වය තෝරාගත යුතුය.

පිළිගත හැකි ක්ෂයවීමේ ක්‍රමවලට ඇතුළත්විය හැක්කේ සරල මාර්ගික ක්‍රමය, හීනවන ශේෂ ක්‍රමය, නිෂ්පාදන ඒකක ක්‍රමය වැනි භාවිතය පදනම මත වන ක්‍රම වේ.

## ප්‍රතිහඳුනාගැනීම

6.15 දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක් අස්තිත්ත්වයක් ප්‍රතිහඳුනාගත යුත්තේ:

(අ) බැහැර කිරීම මත;හෝ

(ආ) එහි භාවිතයෙන් හෝ බැහැර කිරීමෙන් ප්‍රයෝජනවත් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විටදීය.

6.16 අයිතමය ප්‍රතිහඳුනාගත්විට දේපළ පිරියත හෝ උපකරණ අයිතමයේ ප්‍රතිහඳුනාගැනීම මත වන ප්‍රතිලාභ හෝ අලාභ, ලාභ හෝ අලාභවල හඳුනාගත යුතුය. එවැනි ප්‍රතිලාභ අයභාරය ලෙස අස්තිත්ත්වය වර්ගීකරණය නොකළ යුතුය.

6.17 බැහැර කළ දිනය වනුයේ වත්කමේ හිමිකමේ අවදානම් සහ ප්‍රදානය පැවරෙන දිනයයි.

6.18 පිරියත, දේපළ හා උපකරණ අයිතමයක් ප්‍රතිහඳුනා ගැනීමෙන් පැන නගින ප්‍රතිලාභ හෝ අලාභ අස්තිත්ත්වයක් විසින් නිර්ණය කළ යුත්තේ යම් වේනම් බැහැර කිරීමෙන් ලත් ශුද්ධ මුදලින් අයිතමයේ ධාරණ වටිනාකම අඩු කිරීමෙනි.

## හෙළිදරව් කිරීම්

6.19 සෑම පන්තියකම දේපළ, පිරියත සහ උපකරණ සඳහා අස්තිත්ත්වයක් පහත සඳහන් දෑ හෙළිදරව් කළ යුතුය:

(අ) දළ ධාරණ වටිනාකම නිර්ණය කිරීමට භාවිත කළ මිණුම් කිරීමේ පදනම්;

(ආ) භාවිත කළ ක්ෂය කිරීමේ ක්‍රම;

(ඇ) ප්‍රයෝජ්‍ය ජීවකාල හෝ භාවිත කළ ක්ෂය කිරීමේ අනුපාතික;

(ඈ) දළ ධාරන වටිනාකම, සමුච්චිත ක්ෂය සහ වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදය ආරම්භයේ අවසානයේ යම් සමුච්චිත හානිකරණ අලාභ වේ නම්; සහ

(ඉ) වෙනම වෙනම පහත දෑ පෙන්වමින් වාර්තා කරනු ලබන කාල පරිච්ඡේදය ආරම්භයේ සිට අවසානය තෙක් වූ ධාරණ වටිනාකමේ සැසඳීමක්;

(i) එකතු කිරීම්;

(ii) බැහැර කිරීම්;

(iii) ක්ෂය කිරීම්;

(iv) හානිකරණය;

මෙම සැසඳීම පූර්ව කාල පරිච්ඡේද සඳහා ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

6.20 අස්තිත්ත්වයට සීමාවලට යටත් හිමිකමක් හෝ වගකීම් සඳහා ඇප වශයෙන් ඔඩපනය කළ දේපළ, පිරියත සහ උපකරණවල පැවැත්ම සහ ධාරන වටිනාකම් ද එලෙසම අස්තිත්ත්වයක් හෙළිදරව් කළ යුතුය.

## *7 වන පරිච්ඡේදය - කල්බදු*

### විෂය පථය

7.1 කල්බද්දක් යනු එකඟ වූ කාලපරිච්ඡේදයක් සඳහා, ගෙවීමක් හෝ ගෙවීම් මාලාවක් ලබා ගැනීමේ ප්‍රතිලාභයක් ලෙස වත්කමක් පාවිච්චි කිරීමේ අයිතිය බදු දීමනාකරු විසින් බදු ගැනුම්කරු වෙත පවරා දෙනු ලබන ගිවිසුමකි. කල්බද්දක් කල්බදු කාලසීමාව අවසානයේදී බදු දීමනාකරු වත්කමේ අයිතිය බදු ගැනුම්කරුට පැවරිය හෝ නොපැවරිය හැකිය.

7.2 මෙම පරිච්ඡේදයෙන් පහත සඳහන් කල්බදු හැර සියලුම කල්බදු සඳහා වන ගිණුම්කරණය ආවරණ කෙරේ:

(අ) ඛණිජ, තෙල්, ස්වභාවික ගෑස් හා සමාන පුනර්ජනනය නොවන සම්පත් ගවේෂණය හෝ භාවිත කිරීම සඳහා වන කල්බද්දක්;

(ආ) චලන රූප, චිත්‍රපට, වීඩියෝ පටිගත කිරීම්, නාට්‍ය, අත්පිටපත් ස්වාධිකාර හෝ ප්‍රකාශන අයිතීන් වැනි අයිතමයන් සඳහා වූ බලපත්‍ර ගිවිසුම් සඳහා වූ කල්බද්දක්;

(ඇ) ජීව විද්‍යාත්මක වත්කමක් සඳහා වූ කල්බද්දක්; සහ

(ඈ) (i) අයිතියට ආනුශංගික සියලු අවදානම සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස පැවරෙන සහ;

(ii) වත්කමේ ප්‍රයෝජ්‍ය ජීවකාලය කල්බදු කාලපරිච්ඡේදයේ සැලකිය අන්දමේ කොටසක් නොවන කල්බද්දක්.

### කල්බදු ගැනුම්කරුගේ මූල්‍ය ප්‍රකාශන

7.3 බදු දීමනාකරුට කරන ගෙවීම්, බදු දීමනාකරුගේ අපේක්ෂිත උද්ධමනකාරී පිරිවැය ඉහළයාම්වලට හානිපූර්ණය කිරීමට අපේක්ෂිත සාමාන්‍ය උද්ධමනයට අනුකූලව ඔහුට කරන ගෙවීම් වැඩිකිරීමට කල්බදු වාරිකය ව්‍යුහගත කර ඇත්නම් මිස කල්බදු ගැනුම්කරු කල් බදු ගෙවීම් සරල මාර්ගික පදනමක් මත වියදමක් ලෙස හඳුනාගනී.

### කල්බදු දීමනාකරුගේ මූල්‍ය ප්‍රකාශන

7.4 කල්බදුවලට යටත් වත්කම් වත්කමේ ස්වභාවය අනුව කල්බදු දීමනාකරු වත්කම් සහ වගකීම් ප්‍රකාශනයේ ඉදිරිපත් කළ යුතුය.

7.5 බදු දීමනාකරුගේ අපේක්ෂිත උද්ධමනකාරී පිරිවැය ඉහළයාම්වලට හානිපූර්ණය කිරීම අපේක්ෂිත සාමාන්‍ය උද්ධමනයට අඩුකළවිට ඔහුට ලැබෙන ආදායම වැඩිකිරීමට කල්බදු වාරිකය ව්‍යුහගත කර නැත්නම් හැර බදුදීමනාකරු කල්බදු ආදායම, කල්බදු කාලසීමාව පුරා සරල මාර්ගික පදනම යටතේ ලාභ හෝ අලාභ වල හඳුනාගත යුතුය.

7.6 කල්බදු ආදායම උපයාගැනීමේ දරණ පිරිවැය ක්ෂය කිරීම ඇතුළුව වියදමක් ලෙස කල්බදු දීමනාකරු හඳුනාගත යුතුය.

## හෙළිදරව්කිරීම්

7.7 කල්බදු සඳහා බදුගැනුම්කරු පහත සඳහන් හෙළිදරව් කිරීම් කළ යුතුය:

(අ) වියදම් ලෙස හඳුනාගත් කල්බදු ගෙවීම;

(ආ) බදුගැනුම්කරුගේ සැලකියයුතු අන්දමේ කල්බදු එකඟවීම් සඳහා සාමාන්‍ය විස්තරයක් උදාහරණ වශයෙන්, අසම්භව්‍ය කුලී, අළුත් කිරීමේ හෝ මිලදී ගැනීමේ විකල්ප සහ වැඩිවීම් සම්බන්ධ වගන්ති උපකල්බදු සහ කල්බදු එකඟවීම් විසින් පනවා ඇති සීමාකිරීම් ඇතුළුව.

## *8 වන පරිච්ඡේදය - සේවක ප්‍රතිලාභ*

## සාමාන්‍ය හඳුනාගැනීමේ මූලධර්ම

8.1 අධ්‍යක්ෂවරුන් සහ කළමනාකාරිත්වය ඇතුළුව සේවකයින් ලබාදුන් සේවයට හුවමාරුවක් වශයෙන් අස්තිත්ත්වයක් ලබාදෙන ප්‍රතිෂ්ඨාව සේවක ප්‍රතිලාභ වේ. එහි සේවකයින් අස්තිත්ත්වයට ලබාදුන් සේවාවේ ප්‍රතිඵලයක් ලෙස ඔවුන් හිමිකම් ලබන සේවක ප්‍රතිලාභවල පිරිවැය අස්තිත්ත්වයක් මෙම පරිච්ඡේදයේ සඳහන් අවශ්‍යතා ප්‍රකාරව හඳුනාගත යුතුය:

(අ) වගකීමක් වශයෙන්, එක්කෝ මේ වනවිටත් සේවකයනට ඍජුව ගෙවන ලද හෝ සේවක ප්‍රතිලාභ අරමුදලකට දායක ලෙස ගෙවූ වටිනාකම් අඩුකිරීමෙන්, ගෙවූ වටිනාකම් වාර්තාකරනු ලබන දිනට පෙර සේවාවන්ගෙන් පැන නගින බැඳියාවන්ට වඩා වැඩිනම් එම අතිරික්තය වත්කමක් ලෙස, අනාගත ගෙවීම්වලින් අඩුකිරීමෙන් මුදල් ආපසු ගෙවීමට වන ප්‍රමාණයට වත්කමක් ලෙස අස්තිත්ත්වය හඳුනාගත යුතුය;

(ආ) මෙම ප්‍රමිතයේ වෙනත් පරිච්ඡේදයකින් තොග හෝ දේපළ, පිරියත සහ උපකරණ වැනි වත්කමක කොටසක් ලෙස පිරිවැය හඳුනාගැනීම අවශ්‍ය කරන්නේ නම් හැර වියදමක් ලෙස.

## නිශ්චිත සේවක ප්‍රතිලාභ

8.2 සේවකයෙක් අස්තිත්ත්වයකට සිය සේවය ලබාදුන්විට, ලාභ හෝ අලාභවල හඳුනාගත් වටිනාකම් අස්තිත්ත්වයක් පහත දැක්වෙන පරිදි හඳුනාගත යුතුය:

(අ) සේවය ලබාදුන් වාර්තාකරන ලද කාලපරිච්ඡේදය තුළදී, වැටුප් හා වේතන, සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදලේ දායකවීම් වෛද්‍ය රක්ෂණවාරික, වාහනයක් හෝ නිවසක් භාවිතයට ගැනීම වැනි සේවා කාලපරිච්ඡේදයට කෙටි කාලපරිච්ඡේදය තුළදී හෝ සේවා කාලයට පසුව ගෙවිය යුතු ප්‍රතිලාභ;

(ආ) සේවය ලබාදුන් වාර්තාකරනු ලැබූ කාලපරිච්ඡේදයේදී ගෙවන ලද ප්‍රසාද මුදල් සහ ලාභ බෙදාගැනීම්;

(ඇ) වාර්තාකරනු ලබන කාලපරිච්ඡේදයේදී රක්ෂණයකින් ආවරණය නොවන සේවක ප්‍රතිලාභ වශයෙන් හිමිකම්පාන වෛද්‍ය ප්‍රතිලාභ;

(ඈ) නිවාඩු ලබාගත් වාර්තාකරන කාලපරිච්ඡේදයේ, අනියම් වාර්ෂික හෝ වෛද්‍ය නිවාඩු සඳහා දරන ලද පිරිවැය.

8.3 සේවා නියුක්තිය සමාප්ත වනදින සේවකයා සේවයෙන් ඉවත් වන්නේ නම්, පාරිතෝෂික මුදල වැනි සේවාව සමාප්ති කිරීමේ කාලපරිච්ඡේදය අවසානයේ ගෙවිය යුතු වරප්‍රසාද වැනි ප්‍රතිලාභ මුදල වගකීමක් ලෙස හඳුනාගනී. සමාප්ති ප්‍රතිලාභ සඳහා හිමිකම් ලැබීමට සේවය කළ යුතු අවම කාලපරිච්ඡේදයේ සම්පූර්ණ නොකළ සේවකයන් සඳහා කාලපරිච්ඡේදය අවසන වගකීම මැනීම සඳහා සැලකිල්ලට ගනු නොලැබේ.

8.4 සාමාන්‍ය විශ්‍රාම ගතයුතු දිනට පෙර සේවකයෙකුගේ සේවය අවසන් කිරීමට අස්තිත්ත්වය ගත් තීරණයක ප්‍රතිඵලයක් ලෙස ගෙවිය යුතු ප්‍රතිලාභ එම තීරණය සේවකයාට සංනිවේදනය කළ වාර්තා කරනු ලබන කාල පරිච්ඡේදයේ හඳුනාගනු ලැබේ.

8.5 එම ප්‍රතිලාභවලට හුවමාරුවක් ලෙස ස්වේච්ඡා සේවක අතිරික්ත ප්‍රතිලාභ පිළිගැනීමට සේවකයකු තීරණය කළහොත් සේවකයා එම තීරණය පිළිගත් වාර්තාකරනු ලබන කාලපරිච්ඡේදයේ ලාභ හෝ අලාභවල එම ප්‍රතිලාභ හඳුනාගැනේ.

## *9 වන පරිච්ඡේදය - අයභාරය*

### විෂය පථය

9.1 අයභාර යනු ගලාඒම්වල ප්‍රතිඵලයක් ලෙස ස්කන්ධයට සහභාගිවන්නන්ගෙන් වූ දායකවීම්වලට සම්බන්ධ නැති ස්කන්ධයේ වෙනත් වැඩිවීම් ඇතිවන කාලපරිච්ඡේදය තුළදී අස්තිත්ත්වයක සාමාන්‍ය කටයුතු කරගෙන යාමේදී පැන නගින ආර්ථික ප්‍රතිලාභ වල දළ ගලාඒම් වේ. පහත සඳහන් ගනුදෙනු සහ සිද්ධීන්වලින් පැනනගින අයභාරය ගිණුම්කරණය සඳහා මෙම පරිච්ඡේදය ව්‍යවහාර කළ යුතුය:

(අ) භාණ්ඩ විකුණුම් (විකිණීම සඳහා අස්තිත්ත්වය නිෂ්පාදනය කළ හෝ නැවත විකිණීම සඳහා මිලදී ගත් හෝ);

(ආ) සේවා සැපයීමේදී;

(ඇ) අස්තිත්ත්වය කොන්ත්‍රාත් කරුවෙක් නම්, ඉදිකිරීම් කොන්ත්‍රාත්තු, ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවක් යනු වත්කමක් හෝ වත්කම් වල ආකෘතිය, තාක්ෂණය සහ කාර්යය හෝ ඒවායේ අවසාන අරමුණ හෝ භාවිතය සම්බන්ධයෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප ලෙස සම්බන්ධ හෝ අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙක මත රඳා පවතින වත්කම් පන්තියක් ඉදිකිරීම සඳහා නිශ්චිත ලෙස එළඹෙන ලද ගිවිසුමකි; සහ

(ඈ) පොළියක් එලදාව වන තැන්පතු හෝ ලැබිය යුතු දෑ.

### අයභාරය මැනීම

9.2 අස්තිත්ත්වයක් අයභාරය මැනිය යුත්තේ ලැබුන හෝ ලැබියයුතු ප්‍රතිෂ්ඨාවේ වටිනාකමටය. ලැබුණ හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාව වනුයේ අස්තිත්ත්වය විසින් අනුමත කළ වෙළඳ වට්ටම්, අප්‍රමාදව නිරවුල් කිරීමේ වට්ටම් සහ පරිමා ප්‍රතිදාන අඩුකිරීමෙන් පසුව වන වටිනාකමයි.

9.3 අස්තිත්ත්වයේ ස්වකීය ගිණුම මත ලැබුන හෝ ලැබිය යුතු ආර්ථික ප්‍රතිලාභවල දළ ගලාඒම් පමණක් අස්තිත්ත්වය අයභාරය ලෙස ඇතුළත් කළ යුතුය. තුන්වන පාර්ශ්ව වෙනුවෙන් අස්තිත්ත්වය අයකරගත් සියලුම මුදල් අයභාරයෙන් ඉවත් කළ යුතුය. රජය වෙනුවෙන් අයකරගත් විකුණුම්

මත හෝ එකතු කළ අගය මත පදනම් වූ සියලුම බදු අයභාරයේ ඇතුළත් නොකළ යුතුය. නියෝජිත සබඳතාවයකදී අයභාරය ලෙස අස්තිත්ත්වය ඇතුළත් කළ යුත්තේ එහි කොමිස් මුදල පමණකි. ප්‍රධානියා වෙනුවෙන් අයකරගත් මුදල් අස්තිත්තවයේ අයභාරය නොවේ.

## භාණ්ඩ විකිණීම

9.4 පහත සඳහන් සියලු කොන්දේසි සපුරාලනවිට අස්තිත්ත්වයක් භාණ්ඩ විකිණීමෙන් වන අයභාරය හඳුනාගත යුතුය:

(අ) භාණ්ඩවල අයිතියේ සැලකිය යුතු අන්දමේ අවදානම් සහ ප්‍රතිලාභ අස්තිත්ත්වය ගැනුම්කරුට පවරා ඇති විට;

(ආ) විකුණූ භාණ්ඩවල අයිතිය පිළිබඳව සාමාන්‍යයෙන් ආශ්‍රිත ප්‍රමාණයේ අඛණ්ඩ කලමනාකාරිත්වය සම්බන්ධයෙන් කටයුතු කිරීම හෝ එම භාණ්ඩ මත සඵල පාලනයක් අස්තිත්ත්වය රඳවාගෙන නොතිබීම;

(ඇ) අයභාරයේ වටිනාකම විශ්වාසදායක ලෙස මැනිය හැකිවීම;

(ඈ) ගනුදෙනුව හා ආශ්‍රිත ආර්ථික ප්‍රතිලාභ අස්තිත්ත්වයට ගලාඒම අපේක්ෂා කළ හැකිවීම (එනම් නොසිදුවෙනවාට වඩා සිදුවිය හැකි බව); සහ

(ඉ) ගනුදෙනුව සම්බන්ධයෙන් දරන ලද හෝ දැරීමට වන පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකිවීම.

9.5 අයිතියේ සැලකිය යුතු අන්දමේ අවදානම් සහ ප්‍රතිලාභ ගැනුම්කරුට අස්තිත්ත්වය පැවරුයේ කුමන විටකදී යන්න තක්සේරු කිරීමේදී ගනුදෙනුවේ තත්ත්වයන් සෝදිසි කිරීම අවශ්‍ය කෙරේ. බොහෝ අවස්ථාවලදී අයිතියේ අවදානම් සහ ප්‍රතිලාභ පැවරීම නෛතික හිමිකම හෝ සන්තකය ගැනුම්කරුට පැවරෙන විටෙක එක වේලාවකට සිදුවේ. මෙය බොහෝ සිල්ලර වෙළඳාම්වලට උදාහරණයකි. අස්තිත්ත්වය හිමිකමේ සැලකිය යුතු අන්දමේ අවදානම් සහ ප්‍රතිලාභ රඳවා තබාගන්නේ නම් අස්තිත්ත්වය අයභාරය හඳුනාගනු නොලැබේ. උදාහරණ වශයෙන් ගනුදෙනුකරුවකට විකුණන භාණ්ඩවල යම් කිසි විශේෂ විකුණුමක් අයභාරය ලැබීම අසම්භව්‍ය නම්.

## සේවා සැපයීම

9.6 සේවාවක් සැපයීම සම්බන්ධ වන ගනුදෙනුවක ප්‍රතිඵලය විශ්වාසදායක ලෙස ඇස්තමේන්තු කළ හැකිනම්, වාර්තාකරනු ලබන කාලපරිච්ඡේදය අවසන අස්තිත්ත්වයක් ගණුදෙනුව හා ආශ්‍රිත අයභාරය හඳුනාගත යුත්තේ ගණුදෙනුව නිමවීමේ අදියරට යොමුකිරීම මගිනි (ප්‍රතිශතයක් වශයෙන් නිමකරන ලද ක්‍රමය ලෙස සමහර අවස්ථාවලදී හඳුන්වනු ලබන) පහත සඳහන් කොන්දේසි සියල්ලම සපුරාලන විට ගනුදෙනුවක ප්‍රතිඵලය විශ්වාසදායක ලෙස ඇස්තමේන්තු කළ හැකිය.

(අ) අයභාරයේ වටිනාකම විශ්වාසදායක ලෙස මැනිය හැකිවීම;

(ආ) ගණුදෙනුව හා ආශ්‍රිත ආර්ථික ප්‍රතිලාභ අස්තිත්ත්වයට ගලාඒම අපේක්ෂා කළ හැකිවීම;

(ඇ) ගණුදෙනුව නිමවී ඇති අදියර වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදය අවසන විශ්වාසදායක ලෙස මැනිය හැකිවීම; සහ

(ඇ) ගණුදෙනුව සම්බන්ධයෙන් දරන ලද සහ ගණුදෙනුව නිමකිරීමට දැරිය යුතු පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකිවීම.

9.7 සේවාවක් සැපයීමට සම්බන්ධවන ගණුදෙනුවක ප්‍රතිඵලය විශ්වාසදායක ලෙස ඇස්තමේන්තු කළ නොහැකි විටෙකදී අස්තිත්ත්වයක් අයභාරය හඳුනාගත යුත්තේ, හඳුනාගත් වියදම් අයකර ගත හැකි ප්‍රමාණයට පමණි.

## ඉදිකිරීම් කොන්ත්‍රාත්

9.8 ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවක ප්‍රතිඵලය විශ්වාසදායක ලෙස ඇස්තමේන්තු කළ හැකිවිට, වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදය අවසන අස්තිත්ත්වයක් පිළිවෙළින් අයභාරය සහ වියදම් හඳුනාගත යුත්තේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව ආශ්‍රිත කොන්ත්‍රාත් අයභාරය සහ කොන්ත්‍රාත් පිරිවැය කොන්ත්‍රාත් ක්‍රියාකාරකම් වල නිමවී ඇති අදියරට යොමුකරමිනි. (ප්‍රතිශතයක් වශයෙන් නිමකරන ලද ක්‍රමය ලෙස සමහර අවස්ථාවලදී හඳුන්වනු ලබන) ප්‍රතිඵලය විශ්වාසදායක ලෙස ඇස්තමේන්තු කිරීමට නිමවී ඇති අදියර සහ අනාගත පිරිවැය පිළිබඳ විශ්වාසදායක ඇස්තමේන්තු අවශ්‍ය කෙරේ.

## ප්‍රතිශතයක් වශයෙන් නිමකිරීමේ ක්‍රමය

9.9 සේවා සැපයීමෙන් වන සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්වලින් වන අයභාරය හඳුනාගැනීමට මෙම ක්‍රමය භාවිතා කෙරේ. සේවා ගනුදෙනුවක් හෝ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවක් කෙරීගෙන යන අතරතුර අස්තිත්ත්වය අයභාර ඇස්තමේන්තු සහ පිරිවැය සමාලෝචනය කළ යුතු අතර අවශ්‍ය වන්නේ නම් ප්‍රතිශෝධනය කළ යුතුය.

9.10 ගනුදෙනුවක හෝ කොන්ත්‍රාත්තුවක නිම වී ඇති අදියර අස්තිත්ත්වය නිර්ණය කළ යුත්තේ ඉටු කරන ලද වැඩ වඩාත් විශ්වාසදායක ලෙස මැනිය හැකි ක්‍රමයක් භාවිත කරමිනි. පිළිගත හැකි ක්‍රමවලට ඇතුළත් වන්නේ:

(අ) ඇස්තමේන්තු කළ සම්පූර්ණ පිරිවැය අනුව මෙතෙක් ඉටුකරන ලද වැඩ සඳහා දරන ලද පිරිවැයේ සමානුපාතිකය. ද්‍රව්‍ය හෝ ඉදිරි ගෙවීම් සඳහා වැනි ඉදිරි ක්‍රියාකාරකම් සඳහා වූ පිරිවැය මෙතෙක් ඉටුකළ වැඩ සඳහා දරනු ලැබූ පිරිවැයට ඇතුළත් නොවේ;

(ආ) ඉටුකරන ලද වැඩ සමීක්ෂණය කිරීම;

(ඇ) සේවා ගනුදෙනුව හෝ කොන්ත්‍රාත් වැඩ භෞතිකව නිමකළ සමානුපාතිකය.

ගනුදෙනුකරුවන්ගෙන් ලැබුන ප්‍රගති ගෙවීම් සහ අත්තිකාරම් ඉටුකළ වැඩ බොහෝවිට පිළිබිඹු නොවේ.

9.11 ද්‍රව්‍ය සහ පෙරගෙවීම් වැනි ක්‍රියාකාරකම් හෝ ගිවිසුමක් වන අනාගත ක්‍රියාකාරකම් සම්බන්ධ පිරිවැය, ඒවා අයකරගැනීම අපේක්ෂා කළ හැකිනම් වත්කමක් ලෙස අස්තිත්ත්වය හඳුනාගත යුතුය.

9.12 යම් පිරිවැයක් අයකරගැනීම අපේක්ෂා කළ නොහැකි නම් වියදමක් ලෙස වහාම එය අස්තිත්ත්වය හඳුනාගත යුතුය.

9.13 ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවක ප්‍රතිඵලය විශ්වාසදායක ලෙස ඇස්තමේන්තු නොකළ හැකිවිටෙක:

(අ) දරන ලද කොන්ත්‍රාත් පිරිවැය අයකර ගත හැකිවනු ඇතැයි අපේක්ෂා කරන ප්‍රමාණයට පමණක් අස්තිත්ත්වය අයභාරය හඳුනාගත යුතුය;

(ආ) අස්තිත්ත්වයක් විසින් කොන්ත්‍රාත් පිරිවැය වියදමක් ලෙස ඒවා දරන ලද කාලපරිච්ඡේදයේදී හඳුනාගත යුතුය.

9.14 ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවක් මත මුළු කොන්ත්‍රාත් පිරිවැය මුළු අයභාරය අභිබවායාම අපේක්ෂා කරන්නේ නම් අපේක්ෂිත අලාභය, බරපතල කොන්ත්‍රාත්තුවක් සඳහා අනුරූපී ප්‍රතිපාදනයක් සහිතව වහාම වියදමක් ලෙස හඳුනාගත යුතුය.

9.15 කොන්ත්‍රාත් අයභාරයක් ලෙස හඳුනාගත් වටිනාකමක් අයකරගැනීම තවදුරටත් අපේක්ෂා කළ නොහැකිවිට එම අයකරගත නොහැකි වටිනාකම කොන්ත්‍රාත් අයභාරයට ගැලපුමක් ලෙස සලකනවා වෙනුවට වියදමක් ලෙස අස්තිත්ත්වය හඳුනාගත යුතුය.

## පොලිය

9.16 පොලිය හඳුනාගත යුත්තේ සඵල පොලී අනුපාතිකය භාවිතා කරමින්ය.

9.17 වත්කමේ ධාරන වටිනාකමට, අනාගත මුදල් ලැබීම් ඇස්තමේන්තු නිරවද්‍යව වට්ටම් වන අනුපාතිකයයි. සඵල පොලී අනුපාතිකය නිර්ණය කරනු ලබන්නේ මූලික හඳුනාගැනීමේදීය. සඵල පොලී ක්‍රමය යටතේ:

(අ) වත්කමක ධාරණ වටිනාකම වනුයේ, සඵල පොලී අනුපාතිකයට වට්ටම් කරනු ලබන අනාගත මුදල් ලැබීම්වල වර්තමාන අගයයි; සහ

(ආ) කාලපරිච්ඡේදයක් ආරම්භයේ වත්කමක ධාරන වටිනාකම කාලපරිච්ඡේදය සඳහා සඵල පොලී අනුපාතිකයෙන් ගුණ කළවිට කාලපරිච්ඡේදය සඳහා පොලී ආදායමට සමාන වේ.

9.18 එකම පොලී අනුපාතිකයට ක්‍රමානුකූලව පොලිය ලැබෙන අවස්ථාවකදී පොලිය ලැබූ වත්කමට සම්බන්ධිත අධිමිල, වට්ටම් හෝ වෙනත් ලැබීම් හෝ ගෙවීම් සම්බන්ධ කරගන්නේ නොමැතිනම් කාලපරිච්ඡේදය සඳහා එම වත්කමට ලැබිය යුතු පොලිය එම කාලපරිච්ඡේදය සඳහා වත්කමෙන් වන පොලී ආදායමයි.

## හෙළිදරව් කිරීම්

### අයභාරය පිළිබඳව සාමාන්‍ය හෙළිදරව් කිරීම්

9.19 අස්තිත්ත්වයක් පහත සඳහන් දෑ හෙළිදරව් කළ යුතුය:

(අ) අදාල වන ස්ථාන වලදී; ගනුදෙනු නිමවීමේ අදියර නිර්ණය කිරීමට තෝරාගත් ක්‍රම ඇතුළුව අයභාරය හඳුනාගැනීම සඳහා තෝරාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති;

(ආ) අවමයක් වශයෙන් පහත දෑ වලින් හටගත් අයභාරය වෙන්වෙන්ව පෙන්වමින්, කාලපරිච්ඡේදය තුළදී එක් එක් ප්‍රභේදනයේ හඳුනාගත් අයභාරයේ වටිනාකම;

(i) භාණ්ඩ විකිණීමෙන්;

(ii) සේවා ලබාදීමෙන්;

(iii) පොලිය;

(iv) කොමිස්; සහ

(v) වෙනත් යම් සැලකිය යුතු වර්ගවල අයභාරය.

### ඉදිකිරීම් කොන්ත්‍රාත් වලින් වන අයභාරයට සම්බන්ධිත හෙළිදරව් කිරීම්

9.20 අස්තිත්ත්වයක් පහත සඳහන් දෑ හෙළිදරව් කළ යුතුය:

(අ) කාලපරිච්ඡේදයේදී අයභාරය ලෙස හඳුනාගත් කොන්ත්‍රාත් අයභාරයේ වටිනාකම;

(ආ) කාලපරිච්ඡේදයේදී හඳුනාගත් කොන්ත්‍රාත් අයභාරය නිර්ණය කිරීමට භාවිතා කළ ක්‍රම; සහ

(ඇ) කෙරීගෙන යන කොන්ත්‍රාත්වල නිම කර ඇති අදියර නිර්ණය කිරීමට භාවිත කළ ක්‍රම

9.21 (අ) කොන්ත්‍රාත් වැඩ සඳහා වත්කමක් වශයෙන් ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු මුදලේ දළ වටිනාකම; සහ

(ආ) කොන්ත්‍රාත් වැඩ සඳහා වගකීමක් වශයෙන් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු මුදලේ වටිනාකම

අස්තිත්ත්වයක් ඉදිරිපත් කළ යුතුය.

## *10 වන පරිච්ඡේදය - ප්‍රතිපාදන සහ අහඹු*

### විෂය පථය

10.1 මෙම පරිච්ඡේදය මෙම ප්‍රමිතයේ වෙනත් පරිච්ඡේද මගින් ආවරණය වන ප්‍රතිපාදනවලට හැර සියලුම ප්‍රතිපාදන (එනම් අනියත කාල නියමයන් හෝ වටිනාකම්) අසම්භව්‍ය වගකීම් අසම්භව්‍ය වත්කම්, වලට ව්‍යවහාර වේ.

පහත සඳහන් ප්‍රතිපාදනවලට සම්බන්ධිත දෑ ඒවාට ඇතුළත් ය:

(අ) කල්බදු;

(ආ) ඉදිකිරීම් කොන්ත්‍රාත්;

(ඇ) සේවක ප්‍රතිලාභ බැඳියාවන්; සහ

(ඈ) ආදායම් බදු.

### මූලික හඳුනා ගැනීම

10.2 අස්තිත්ත්වයක් ප්‍රතිපාදනයක් හඳුනා ගත යුත්තේ:

(අ) අතීත සිද්ධියක ප්‍රතිඵලයක් වශයෙන් වාර්තාකරන දින අස්තිත්ත්වයකට බැඳියාවත් තිබීම;

(ආ) අස්තිත්ත්වයට එය නිරවුල් කිරීමේදී ආර්ථික ප්‍රතිලාභ පැවරීමට අවශ්‍ය වීම අපේක්ෂා කළ හැකි වීම (එනම් නොසිදුවෙනවාට වඩා සිදු විය හැකි බව);

(ඇ) බැඳියාවේ වටිනාකම විශ්වාදායක ලෙස ඇස්තමේන්තු කළ බව වනවිට;

අස්තිත්ත්වයක් ප්‍රතිපාදනයක් හඳුනා ගත යුතුය.

10.3 මෙම ප්‍රමිතයේ වෙනත් පරිච්ඡේදයකින් ප්‍රතිපාදනයක් සඳහා වන පිරිවැය තොග හෝ දේපොළ, පිරියත සහ උපකරණ වැනි වත්කමක කොටසක් ලෙස හඳුනා ගත යුතු වීම අවශ්‍ය කෙරේ නම් හැර අස්තිත්ත්වයක් ප්‍රතිපාදනයක් වත්කම් සහ වගකීම් ප්‍රකාශනයේ හඳුනාගත යුතු අතර ප්‍රතිපාදනයේ වටිනාකම වියදමක් ලෙස හඳුනාගත යුතුය.

## මූලික මිනුම්කරණය

10.4 වාර්තාකරන ලබන දිනදී බැඳියාව නිරවුල් කිරීමට අවශ්‍ය කරන හොඳම ඇස්තමේන්තුවේ වටිනාකමට අස්තිත්ත්වය ප්‍රතිපාදනයක් මැනිය යුතුය. වාර්තා කරනු ලබන දින බැඳියාව නිරවුල් කිරීමට හෝ ඒ අවස්ථාවේදී තුන්වන පාර්ශවයට පැවරීමට අස්තිත්ත්වය තර්කාන්විතව ගෙවිය යුතු වටිනාකම හොඳිම ඇස්තමේන්තුව වේ:

(අ) ප්‍රතිපාදනය අයිතම් සංගහණයකට සම්බන්ධ වනවිට ඇස්තමේන්තුවේ වටිනාකමින් පිළිබිඹු වන්නේ ඒවායේ ආශ්‍රිත සම්භාව්‍යතාවයන්ගේ සියලු සිදුවිය හැකි ප්‍රතිඵලයන්ගේ බර තැබීමය. සිදුවිය හැකි අඛණ්ඩ පරාසයක ප්‍රතිඵල තිබෙන අවස්ථාවකදී, සහ මෙම පරාසයේ එක් එක් ලක්ෂ්‍යය වෙනත් ඕනෑම දෙයක් මෙන් වන විට පරාසයේ මධ්‍ය ලක්‍ෂ්‍යය භාවිත කරනු ලැබේ;

(ආ) තනි බැඳියාවකින් ප්‍රතිපාදනය පැන නගින විට, බැඳියාව නිරවුල් කිරීමට අවශ්‍යකරණ වටිනාකමේ හොඳම ඇස්තමේන්තුව වන්නේ එම බොහෝ දුරට සිදු විය හැකි ප්‍රතිඵලය විය හැකිය. කෙසේ වෙතත් එවැනි අවස්ථාවකදී පවා අස්තිත්ත්වය වෙනස් විය හැකි ප්‍රතිඵලයන් සැළකිල්ලට ගනී. වෙනස් විය හැකි ප්‍රතිඵල බොහෝ දුරට විය හැකි ප්‍රතිඵලවලට වඩා වටිනාකමින් බොහෝදුරට වැඩි හෝ බොහෝ දුරට අඩු නම් වඩාත්ම හොඳම ඇස්තමේන්තුව වනුයේ වැඩි හෝ අඩු වටිනාකමට වඩා තනි බොහෝ දුරට විය හැකි ප්‍රතිඵලයයි.

## පසුව මිනුම්කරණය

10.5 අස්තිත්ත්වයක් ප්‍රතිපාදනයකට එරෙහිව අයකල යුත්තේ ප්‍රතිපාදනය සඳහා මුලින්ම හඳුනාගත් වියදම පමණි.

10.6 සෑම වාර්තාකරනු ලබන දිනයේදීම අස්තිත්ත්වය ප්‍රතිපාදනය සමාලෝචනය කළ යුතු අතර වාර්තා කරනු ලබන දින බැඳියාව නිරවුල් කිරීමට අවශ්‍යකරන වටිනාකමේ ප්‍රවර්තන හොඳම ඇස්තමේන්තුව පිළිබිඹු වීමට ඒවා ගැළපිය යුතුය. මුලින්ම ප්‍රතිපාදනයක් වත්කමක පිරිවැයේ කොටසක් ලෙස හඳුනා ගෙන නොමැත්තේ නම් හැර පෙර හඳුනාගත් වටිනාකමට වන යම් ගැළපීමක් ලාභ හෝ අලාභවල හඳුනා ගත යුතුය.

## අසම්භව්‍ය වගකීම්

10.7 අසම්භව්‍ය වගකීමක් වනුයේ එක්කෝ විය හැකි එහෙත් අනියත බැඳියාවක් හෝ 10.2 ඡේදයේ (ආ) සහ (ඇ) යන තත්ත්වයන් එකක් හෝ දෙකම

සපුරාලීමට අපොහොසත් වීම නිසා හඳුනා නොගන්නා ප්‍රවර්තන බැඳියාවකි. අස්තිත්ත්වයන් අසම්භව්‍ය වගකීමක් වගකීමක් ලෙස හඳුනා නොගත යුතුය. අස්තිත්ත්වයේ බද්ධව හෝ වෙන් වෙන්ව බැඳියාවක් සඳහා වගකිවයුතු වන විට වෙනත් පාර්ශව දැරීමට අපේක්ෂාකරන බැඳියාවේ කොටස අසම්භව්‍ය වගකීමක් ලෙස සළකනු ලැබේ.

## අසම්භව්‍ය වත්කම්

10.8 අතීත සිද්ධීන්ගෙන් පැන නගින සහ එහි පැවැත්ම සම්පූර්ණයෙන්ම අස්තිත්ත්වයේ පාලනයෙන් තොරව එක් හෝ ඊට වැඩි අනාගත සිද්ධීන් සිදුවීම හෝ නොසිදුවීම මගින් පමණක් ඒවා පැවැත්ම සනාථ කෙරෙන වත්කමක් විය හැක්කක් අසම්භව්‍ය වත්කමකි. අස්තිත්ත්වයක් අසම්භව්‍ය වත්කමක්, වත්කමක් ලෙස හඳුනානොගත යුතුය. අස්තිත්ත්වයට ගලා එන අනාගත ආර්ථික ප්‍රතිලාභ ඇත්ත වශයෙන්ම නිශ්චිත වන විට ඒ හා සම්බන්ධිත වත්කම අසම්භව්‍ය වත්කමක් නොවන අතර හඳුනාගැනීම උචිත වේ.

## හෙළිදරව් කිරීම

### ප්‍රතිපාදන පිළිබඳ හෙළිදරව් කිරීම

10.9 සෑම පන්තියකම ප්‍රතිපාදන සඳහා අස්තිත්ත්වයක් පහත සඳහන් සියළු දෑ හෙළිදරව් කළ යුතුය:

(අ) පහත දෑ වල සැසඳීමක් පෙන්වමින්;

(i) කාලපරිච්ඡේදය ආරම්භයේදී සහ අවසානයේදී ධාරණ වටිනාකම;

(ii) කාලපරිච්ඡේදය තුළදී එකතු කිරීම්;

(iii) කාලපරිච්ඡේදය තුළදී ප්‍රතිපාදනයට එරෙහිව අයකළ වටිනාකම; සහ

(iv) කාලසීමාව තුළදී ප්‍රතිවර්ත්‍ය කළ භාවිතයට නොගත් වටිනාකම්;

(ආ) බැඳියාවේ ස්වභාවය සහ අපේක්ෂිත වටිනාකම සහ කාල නියමය යම් ප්‍රතිඵලයක් වන ගෙවීම්වල කෙටි විස්තරයක්;

(ඇ) එම ගලායැම්වල වටිනාකම හෝ කාල නියමයේ අනියතාවය පිළිබඳව ඉඟි කිරීමක්;

(ඈ) අපේක්ෂිත ප්‍රතිපූර්ණය සඳහා හඳුනාගත් යම් වත්කමක වටිනාකම සඳහන් කරමින් යම් අපේක්ෂිත ප්‍රතිපූර්ණය කිරීමක්.

පූර්ව කාලපරිච්ඡේද සඳහා තුලනාත්මක තොරතුරු අවශ්‍ය නොකෙරේ.

### අසම්භව්‍ය වගකීමක් පිළිබඳව හෙළිදරව් කිරීම්

10.10 නිරවුල් කිරීමකදී සම්පත් පිටත ගලායැමක් විය හැකි බව මඳ වන්නේ නම් හැර වාර්තාකරණ දින එක් එක් පන්තියේ අසම්භව්‍ය වගකීම සඳහා අස්තිත්ත්වය විසින් අසම්භව්‍ය වගකීමේ ස්වභාවය පිළිබඳ කෙටි විස්තරයක් සහ ප්‍රායෝගික වන්නේ නම්:

(අ) එහි මූල්‍ය බලපෑමේ ඇස්තමේන්තුවක්;

(ආ) යම් පිටතට ගලායාමක වටිනාකම කාල නියමය සම්බන්ධිත අනියත පිළිබඳ ඇඟවීමක්; සහ

(ඇ) යම් ප්‍රතිපූර්ණයක් විය හැකි බව අස්තිත්ත්වය හෙළිදරව් කළ යුතුය.

එසේ කිරීමට සෑම සාධාරණ උත්සාහයක් ගත් පසුවද, අස්තිත්ත්වයට මෙම හෙළිදරව් කිරීම් එකක් හෝ ඊට වැඩි ගණනක් කළ නොහැකි නම් අස්තිත්ත්වය ඒ බව සඳහන් කළ යුතුය.

### අසම්භව්‍ය වත්කම් පිළිබඳ හෙළිදරව් කිරීම

10.11 ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම් අපේක්ෂා කළ හැකිමුත් (එනම් නොසිදුවෙනවාට වඩා සිදු විය හැකි බව) එහෙත් ඇත්ත වශයෙන් නිශ්චිත නොවන විට (එම නිසා හඳුනා නොගත්) වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදය අවසානයේදී අසම්භව්‍ය වත්කමේ ස්වභාවයේ විස්තරයක් සහ ප්‍රායෝගිකවන විට අනවශ්‍ය පිරිවැයක් හෝ පරිශ්‍රමයක් නොදරමින් ඒවායේ මූල්‍ය බලපෑම අස්තිත්ත්වයක් හෙළිදරව් කළ යුතුය. එසේ කිරීමට සෑම උත්සාහයක් ගත් පසුව ද අස්තිත්ත්වයට මෙම හෙළිදරව් කිරීම කළ නොහැකි නම් අස්තිත්ත්වය ඒ බව සඳහන් කළ යුතුය.

## *11 වන පරිච්ඡේදය - ණය ගැනීම් පිරිවැය*

### විෂය පථය

11.1 මෙම පරිච්ඡේදය ණය ගැනීම් පිරිවැයට සම්බන්ධිත අවශ්‍යතාවයන් නියම කරයි. අරමුදල් ණය ගැනීම සම්බන්ධයෙන් වන අස්තිත්ත්වයක් දරනු ලබන පොලී සහ වෙනත් පිරිවැය ණය ගැනීම් පිරිවැයයි.

### හඳුනා ගැනීම

11.2 සියළු ණය ගැනීමේ පිරිවැය ඒවා දරණ ලද කාලපරිච්ඡේදයේ ලාභ හෝ අලාභවල වියදමක් ලෙස අස්තිත්ත්වයක් හඳුනාගත යුතුය.

### හෙළිදරව් කිරීම

11.3 කාලපරිච්ඡේදයක් තුළදී හඳුනාගත් සියලුම පොලී වියදම අස්තිත්ත්වයක් හෙළිදරව් කළ යුතුය.

## *12 වන පරිච්ඡේදය - විදේශ ව්‍යවහාරික මුදල් පරිවර්තනය කිරීම*

### විෂය පථය

12.1 අස්තිත්ත්වයක මූල්‍ය ප්‍රකාශනවල විදේශ ව්‍යවහාර මුදල් ඇතුළත් කරන්නේ කෙසේද යන්න මෙම පරිච්ඡේදය විස්තර කරයි.

## ක්‍රියාකාරී ව්‍යවහාරික මුදල්

12.2 සෑම අස්තිත්ත්වයක්ම එහි ව්‍යවහාරික මුදල් හඳුනාගත යුතුය. අස්තිත්ත්වය මෙහෙයුම් සිදු කෙරෙන ප්‍රධාන ආර්ථික පරිසරයේ ව්‍යවහාරික මුදල් අස්තිත්ත්වයේ ක්‍රියාකාරී ව්‍යවහාරික මුදලයි.

## විදේශ ව්‍යවහාරික ගණුදෙනු ක්‍රියාකාරී ව්‍යවහාරික මුදලින් වාර්තාකරණය

## මූලික හඳුනා ගැනීම

12.3 විදේශ ව්‍යවහාරික මුදල් ගණුදෙනුවක් යනු නම් කරන ලද හෝ විදේශ ව්‍යවහාරික මුදලකින් නිරවුල් කළ යුතු, අස්තිත්ත්වයක් නියැලෙන ගණුදෙනු වන අතර පහත අවස්ථාවන්ද ඊට ඇතුළත් වේ:

අ) විදේශ ව්‍යවහාරික මුදලකින් මිල නම් කළ භාණ්ඩ හෝ සේවා මිලට ගැනීමක් හෝ විකිණීම;

ආ) අරමුදල් ණය ගැනීමකදී හෝ ණය දීමකදී ගෙවිය යුතු හෝ ලැබිය යුතු දෑ වටිනාකම් විදේශ ව්‍යවහාරික මුදලකින් නම් කර ඇති විටක;

ඇ) වෙනත් ලෙසකින් වත්කම් අත්කර ගැනීම හෝ බැහැර කිරීම හෝ වගකීම් දැරීම හෝ නිරවුල් කිරීම විදේශ ව්‍යවහාර මුදලකින් නම් කිරීම.

12.4 ගණුදෙනුව වූ දින ක්‍රියාකාරී ව්‍යවහාර මුදල සහ විදේශ ව්‍යවහාරික මුදල අතර තත්කාලීන විනිමය අනුපාතිකයකට වන විදේශ ව්‍යවහාරික මුදල් වටිනාකම ව්‍යවහාර කරමින් මූලික හඳුනා ගැනීමේදී විදේශ ව්‍යවහාරික මුදල් ගණුදෙනුවක් අස්තිත්ත්වයක් හඳුනාගත යුත්තේ ක්‍රියාකාරී ව්‍යවහාරික මුදලිනි.

12.5 ගණුදෙනුව වූ දිනය වන්නේ මෙම ප්‍රමිතය අනුව හඳුනා ගැනීම සඳහා ගණුදෙනුව පළමුව සුදුසුකම් ලැබූ දිනය වේ. ප්‍රායෝගික හේතු නිසා ගණුදෙනුව සිදු වූ දින සත්‍ය අනුපාතිකයට ආසන්නවන අනුපාතිකය බොහෝවිට භාවිත කෙරේ. උදාහරණ වශයෙන්:

(අ) එම කාලපරිච්ඡේදය තුළදී සිදු වූ එක් එක් විදේශ ව්‍යවහාරික මුදල් ගණුදෙනු සියල්ල සඳහා සතියක් හෝ මාසයක සාමාන්‍ය අනුපාතිකය භාවිත කළ හැකිය; හෝ

(ආ) ගණුදෙනුව සිදු වූ දින සිට කෙටි කාලපරිච්ඡේදයක් තුළදී නිරවුල් කිරීම සිදුවී නම්, ලැබිය යුතු දෑ හෝ ගෙවිය යුතු දෑ සම්බන්ධිත නිරවුල් කිරීම සඳහා භාවිත කළ අනුපාතිකය භාවිත කළ හැකිය.

## පසුව වාර්තා කරනු ලැබූ කාලපරිච්ඡේදයක් අවසාන වාර්තාකරණය

12.6 සෑම වාර්තාකරණු ලබන කාලපරිච්ඡේදයක් අවසාන අස්තිත්ත්වයක් විසින්:

(අ) විදේශ ව්‍යවහාරික මුදල් මූල්‍ය අයිතම අවසාන අනුපාතිකය ව්‍යවහාර කර පරිවර්තනය කිරීම; සහ

(ආ) විදේශ ව්‍යවහාරික මුදලින් ඇති මූල්‍ය නොවන අයිතම් ගණුදෙනුව සිදු වූ දින විනිමය අනුපාතිකය භාවිත කරමින් පරිවර්තනය කිරීම කළ යුතුය; සහ

12.7 කාලපරිච්ඡේදය තුළ මූලික හඳුනා ගැනීම මත හෝ පූර්ව කාලපරිච්ඡේද තුළදී මූල්‍ය අයිතම් ඒ පරිවර්තනය කළ අනුපාතික වලට වඩා වෙනස් අනුපාතිකයක් මත පරිවර්තනය කිරීම හෝ මූල්‍ය අයිතම් නිරවුල් කිරීම් මත පැන නගින විනිමය වෙනස්කම් ඒවා පැන නැගුණ කාලපරිච්ඡේදයේ ලාභ හෝ අලාභ ගිණුමේ අස්තිත්ත්වය හඳුනාගත යුතුය.

## ව්‍යවහාරික මුදල් හැර ඉදිරිපත් කිරීමේ ව්‍යවහාරික මුදල් භාවිත කිරීම

## ඉදිරිපත් කරනු ලබන ව්‍යවහාරික මුදල්වලට පරිවර්තනය කිරීම

12.8 අස්තිත්ත්වයක් එහි මූල්‍ය ප්‍රකාශන ඕනෑම ව්‍යවහාර මුදලකින් (ව්‍යවහාර මුදල් වලින්) ඉදිරිපත් කළ හැකිය. ඉදිරිපත් කරනු ලබන ව්‍යවහාර මුදල් අස්තිත්ත්වයේ ක්‍රියාකාරී ව්‍යවහාර මුදල් වලින් වෙනස් නම් අස්තිත්ත්වයන් විසින් එහි ආදායම්, වියදම් වත්කම් සහ වගකීම් අයිතම් ඉදිරිපත් කරනු ලබන ව්‍යවහාරික මුදල් වලට පරිවර්තනය කළ යුතුවේ.

12.9 අස්තිත්ත්වයක් විසින් එහි ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් අයිතම් පහත ක්‍රියාපටිපාටියේ භාවිත කරමින් වෙනස් ඉදිරිපත් කිරීමේ ව්‍යවහාරික මුදල් වලට පරිවර්තනය කළ යුතුවේ:

(අ) ඉදිරිපත් කරනු ලැබූ එක් එක් ප්‍රකාශනයේ වත්කම් සහ වගකීම් පරිවර්තනය කළ යුත්තේ එම වත්කම් සහ වගකීම් ප්‍රකාශනයේ දිනයේ ඇති අවසාන අනුපාතිකයටය;

(ආ) එක් එක් ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ දක්වෙන ආදායම් සහ වියදම් සහ රඳවාගත් ඉපයීම් පරිවර්තනය කළ යුත්තේ ගණුදෙනුව සිදු වූ දිනයන්හි විනිමය අනුපාතිකයන්ටය; සහ

(ඇ) ප්‍රතිඵලයක් වන සියළුම විනිමය වෙනස්කම් ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ සහ රඳවා ගත් ඉපයීම්වල හඳුනාගත යුතු වන්නේ, වාර්තාකරණ ලද කාලපරිච්ඡේදයේ ලාභය හෝ අලාභ නීර්ණය කිරීමේදී වූ අයිතමයක් ලෙස නොව එහෙත් ඉදිරියට ගෙන ආ රඳවාගත් ඉපයීම් නීර්ණය කිරීමේදී හඳුනාගත් අයිතමයක් ලෙස.

12.10 ප්‍රායෝගික හේතු සඳහා ගණුදෙනුවන දිනයන්යහි විදේශ විනිමය අනුපාතිකයට ආසන්නවන අනුපාතිකයක් අස්තිත්ත්වයක් භාවිත කළ හැකිය. උදාහරණ වශයෙන් ආදායම් සහ වියදම් අයිතම් පරිවර්තනය කිරිමට කාලපරිච්ඡේදය සඳහා සාමාන්‍ය අනුපාතිකයක් අස්තිත්ත්වයට භාවිත කළ හැකිය.

# *13 වන පරිච්ඡේදය - සම්බන්ධිත පාර්ශව හෙලිදරව් කිරීම්*

## විෂය පථය

13.1 සම්බන්ධිත පාර්ශව සමඟ ගණුදෙනු සහ එම පාර්ශව සමඟ හිගව ඇති ශේෂයන් සම්බන්ධයෙන් අවශ්‍ය හෙළිදරව් කිරීම් එහි මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීම මෙම පරිච්ඡේදයෙන් අවශ්‍ය කෙරේ.

## සම්බන්ධිත පාර්ශවයක නිර්වචනය

13.2 එහි මූල්‍ය වාර්තා පිළියෙල කරනු ලබන අස්තිත්ත්වයකට සම්බන්ධිත පුද්ගලයෙක් හෝ අස්තිත්ත්වයක් සම්බන්ධිත පාර්ශවයක් වේ (වාර්තාකරණ ආයතනය).

13.3 පුද්ගලයෙක් (හෝ අස්තිත්ත්වයක්) හෝ එම පුද්ගලයාගේ පවුලේ ළඟම ඥාතියෙක් වාර්තාකරණ ආයතනයට සම්බන්ධිත වන්නේ නම් එම පුද්ගලයා (හෝ අස්තිත්ත්වය):

(අ) වාර්තාකරණ අස්තිත්ත්වය මත පාලනයක් තිබීම;

(ආ) වාර්තාකරණ අස්තිත්ත්වය මත බද්ධ පාලනයක් හෝ සැලකිය යුතු අන්දමේ බලපෑමක් තිබීම හෝ එහි සැළකිය යුතු අන්දමේ ඡන්ද බලයක් තිබීම; හෝ

(ඇ) සම්බන්ධිත පාර්ශවය පාලනයට, බද්ධ පාලනයට හෝ සැළකිය යුතු අන්දමේ බලපෑමකට යටත් අස්තිත්ත්වයක්

## හෙළිදරව් කිරීම

### පරිපාලිත - පරිපාලක සම්බන්ධතාවය හෙළිදරව් කිරීම

13.4 සම්බන්ධිත පාර්ශව ගණුදෙනු තිබුණේද යන්න නොසළකා පරිපාලිතය සහ එහි පරිපාලකය අතර සබඳතාවය හෙළිදරව් කළ යුතුය. අස්තිත්ත්වයක් එහි පරිපාලකයේ නම හෙළිදරව් කළ යුතුවේ, සහ වෙනස් වන්නේ නම් අවසාන පාලනය කරනු ලබන පාර්ශවය හෙළිදරව් කළ යුතුය. අස්තිත්ත්වයේ පරිපාලකය හෝ අවසාන වශයෙන් පාලනය කරන පාර්ශවය පොදු පරිශීලනය සඳහා ලබාගත හැකි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකරන්නේ නම්, එසේ ඉදිරිපත් කරනු (යම් වේ නම්) ඊළඟ වඩාත් ජ්‍යෙෂ්ඨ පරිපාලකගේ නමද එලෙස හෙළිදරව් කළ යුතුය.

### සම්බන්ධිත පාර්ශව සම්බන්ධ ගණුදෙනු හෙළිදරව් කිරීම

13.5 මිලක් අය කරන්නේද යන්න නොසළකා සම්බන්ධිත පාර්ශව ගණුදෙනුවක් යනු වාර්තා කරනු ලබන අස්තිත්ත්වය සහ සම්බන්ධිත පාර්ශවය අතර සම්පත් සේවා හෝ බැඳියාවන් හුවමාරු කර ගැනීමයි. සම්බන්ධිත පාර්ශවයේ ගණුදෙනු සඳහා උදාහරණ වලට ඇතුළත් වන්නේ, (එහෙත් ඒවාට පමණක් සීමා නොවේ):

(අ) අස්තිත්ත්වය සහ එහි ප්‍රධාන අයිතිකරු(වන්) අතර ගනුදෙනු;

(ආ) අස්තිත්ත්ව දෙකම තනි අස්තිත්ත්වයක හෝ පුද්ගලයකුගේ පොදු පාලනය යටතේ වන අස්තිත්ත්වයක් සහ වෙනත් අස්තිත්ත්වයක් අතර ගනුදෙනු, සහ;

(ඇ) වෙනත් අයුරකින් වාර්තාකරන අස්තිත්ත්වය විසින් දැරිය යුතු වූ වියදම් එහෙත් අස්තිත්ත්වය හෝ වාර්තාකරන අස්තිත්ත්වය පාලනය කරන පුද්ගලයෙක් දරන වියදම් සඳහා වන ගනුදෙනු.

13.6 අස්තිත්ත්වයට සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු තිබේනම්, සම්බන්ධිත පාර්ශ්වයේ සම්බන්ධතාවයේ ස්වභාවය මෙන්ම ගනුදෙනු, හිඟ ශේෂ සහ එමෙන්ම මූල්‍ය ප්‍රකාශන මත සම්බන්ධතාවයේ භව්‍ය බලපෑමේ පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට අවශ්‍ය කරන බැඳියාවන්ද අස්තිත්ත්වය හෙළිදරව් කළ යුතුය. එවැනි ගනුදෙනුවලට ඇතුළත් වියහැක්කේ මිලදී ගැනුම්, විකුණුම් හෝ භාණ්ඩ හෝ සේවා මාරුකිරීම් (පැවරීම්), කල්බදු, ඇපවීම්, සහ සම්බන්ධිත පාර්ශ්ව වෙනුවෙන් අස්තිත්ත්වය කරනු ලබන නිරවුල් කිරීම් හෝ ප්‍රතිලෝම වශයෙන්:

13.7 ඒවා සම්බන්ධිත පාර්ශ්වයක් සමග වන්නේ නම් හෙළිදරව් කළ යුතු වන ගනුදෙනු සඳහා උදාහරණ පහත දක්වේ:

(අ) භාණ්ඩ මිලදී ගැනුම් හා විකුණුම් (නිමකළ හෝ නොනිමි);

(ආ) දේපළ සහ වෙනත් වත්කම් මිලදී ගැනීම හෝ විකිණීම;

(ඇ) සේවකයෙක් වශයෙන් හෝ අධ්‍යක්‍ෂවරයෙක් වශයෙන් ලබාගත් හෝ ලබාදුන් සේවාවන්;

(ඈ) කල්බදු;

(ඉ) පර්යේෂණ සහ සංවර්ධන මාරු කරගැනීම;

(ඊ) බලපත්‍ර ගිවිසුම් යටතේ මාරු කරගැනීම;

(උ) මූල්‍ය විධිවිධාන යටතේ මාරුකරගැනීම (ණය, මුදලින් හෝ ද්‍රව්‍යවලින් ස්කන්ධ දායකවීම්);

(ඌ) ඇප ප්‍රතිපාදන හෝ අතිරේක ඇප;

(එ) අස්තිත්ත්වය වෙනුවෙන් වගකීම් නිරවුල් කිරීම හෝ වෙනත් පාර්ශ්වයක් වෙනුවෙන් අස්තිත්ත්වය වගකීම් නිරවුල් කිරීම;

(ඒ) සමූහ අස්තිත්ත්ව අතර අවදානම බෙදීයන නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මකට පරිපාලකය සහභාගී වීම.

13.8 අතේදුරින් වන ගනුදෙනුවක පවතින භාෂිතයන්ට සමාන සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සිදුකර ඇති විට එවැනි භාෂිතයන් තහවුරු කළ හැකිනම් මිස ඒවා අස්තිත්ත්වය සඳහන් නොකළ යුතුය.

13.9 අස්තිත්ත්වයේ මූල්‍ය ප්‍රකාශන මත සම්බන්ධිත පාර්ශ්ව වල ගනුදෙනුවල බලපෑම පිළිබඳව අවබෝධයක් ලබාගැනීමට වෙනම හෙළිදරව් කිරීමක් අවශ්‍ය කරනවිට හැර එක හා සමාන ස්වභාවයේ අයිතම සමාහරණය කර අස්තිත්ත්වයක් හෙළිදරව් කළ හැකිය.

## *14 වන පරිච්ඡේදය - රාජ්‍ය ප්‍රදාන*

### විෂය පථය

14.1 රාජ්‍ය ප්‍රදානවලට සම්බන්ධ අවශ්‍යතාවයන් මෙම ප්‍රමිතය නියම කරයි. රාජ්‍ය ප්‍රදාන යනු අස්තිත්ත්වයක මෙහෙයුම් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් සමහර කොන්දේසි සමග අතීත හෝ අනාගත අනුකූලතාවය සඳහාවන ප්‍රතිලාභයක් වශයෙන් සම්පත් මාරුකිරීමක ස්වරූපයෙන් අස්තිත්ත්වයකට රජය විසින් ලබාදෙන අනුග්‍රහයන් වේ.

14.2 සාධාරණ වශයෙන් වටිනාකමක් තැබිය නොහැකි රාජ්‍ය අනුග්‍රහයන් සහ අස්තිත්ත්වයේ සාමාන්‍ය වෙළඳ ගනුදෙනුවලින් වෙන්ව හඳුනාගත නොහැකි රජය සමග වූ ගනුදෙනු රාජ්‍ය ප්‍රදාන වලට අයත් නොවේ.

14.3 බදු අයකළ හැකි ආදායම නිර්ණය කිරීමේදී හෝ ආදායම් බදු පදනම මත නිර්ණය කරනු හෝ සීමාකරනු ලබන ප්‍රතිලාභ ස්වරූපයෙන් අස්තිත්ත්වයට රාජ්‍ය අනුග්‍රහයන් මෙම පරිච්ඡේදයෙන් ආවරණය නොවේ. එවැනි ප්‍රතිලාභ සඳහා උදාහරණ වනුයේ ආදායම් බදු විරාම, ආයෝජන බදු බැර, ත්වරිත කරන ලද ක්ෂය දීමනා සහ අඩුකළ ආදායම් බදු අනුපාතික.

### හඳුනාගැනීම සහ මැනීම

14.4 අස්තිත්ත්වයක් රාජ්‍ය ප්‍රදාන පහත දැක්වෙන පරිදි හඳුනාගත යුතුය:

(අ) ලබන තැනැත්තාට නිශ්චය කරන ලද අනාගත කාර්ය සාධනයක් ලබාගැනීමේ කොන්දේසියක් නොපනවා ඇති ප්‍රදානයක් දීමනා ලද මනාව ලැබිය යුතුවිට ආදායමේ හඳුනාගැනීම;

(ආ) ලබන තැනැත්තාට නිශ්චය කරන ලද අනාගත කාර්ය සාධනයන් ලබාගැනීමේ කොන්දේසියක් පනවා ඇති විට එක කාර්ය සාධන කොන්දේසිය සපුරාලනවිට පමණක් ආදායමේ හඳුනාගැනීම;

(ඇ) වියදම් දැරීමට ලබාදුන් ප්‍රදානයක්, එම වියදම් ලාභ හෝ අලාභ වල හඳුනාගත් කාලපරිච්ඡේදවල ආදායමේ හඳුනාගනු ලැබේ;

(ඈ) වත්කමක් අත්කරගැනීමට ලබාදුන් ප්‍රදානයක්, වත්කමේ ප්‍රයෝජ්‍ය ජීවකාලය තුළ ක්‍රමානුකූල පදනමක් මත හඳුනා ගැනේ;

(ඉ) අයභාරය හඳුනාගැනීමේ නිර්ණායකය තෘප්ත කිරීමට පෙර ලැබුන ප්‍රදාන වත්කම් සහ වගකීම් ප්‍රකාශනයේ අසම්භව්‍ය ආදායම ලෙස හඳුනාගැනේ.

14.5 ලැබුන හෝ ලැබිය යුතු වත්කමේ වටිනාකමට අස්තිත්ත්වය ප්‍රදාන මැනිය යුතුය.

## හෙළිදරව් කිරීම

14.6 රාජ්‍ය ප්‍රදානයන් සම්බන්ධයෙන් අස්තිත්ත්වයන් පහත සඳහන් දෑ හෙළිදරව් කළ යුතුය:

(අ) මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත් රාජ්‍ය ප්‍රදානවල වටිනාකම සහ ස්වභාවය;

(ආ) ආදයමේ හඳුනා නොගත් රාජ්‍ය ප්‍රදානවලට ඇඳුන සපුරාලනු නොලැබූ කොන්දේසි සහ වෙනත් අසම්භව්‍යයන්;

(ඇ) අස්තිත්ත්වයට ඍජුව ප්‍රතිලාභ අත් වූ වෙනත් ස්වරූපයේ රාජ්‍ය අනුග්‍රහයන් පිළිබඳ ඇඟවීමක්.

# *15 වන පරිච්ඡේදය - වෙනත් වත්කම් සහ වගකීම්*

## වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ

15.1 අස්තිත්ත්වයක් වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ මූලිකව මැන හඳුනාගත යුත්තේ ගනුදෙනු වූ මිලටය.

15.2 කාලපරිච්ඡේදය අවසානයේ ලැබිය යුතු දෑ වල වටිනාකම අයකරගත හැකිද යන්න සලකාබැලීම සහ සමාලෝචනය කළ යුතුය.

15.3 ලැබිය යුතු දෑ වල (හෝ එහි කොටසක) වටිනාකම අයකරගත නොහැකි නම් සහ එය අයකර ගැනීමට තවදුරටත් උත්සාහයක් නොගැනීමට අස්තිත්ත්වයක් තීරණය කරයි නම්, එම අදාළ වටිනාකම ලැබිය යුතු දෑ වලින් අස්තිත්තවය අඩුකළ හැකි අතර එම වටිනාකම අයකරගත නොහැකි ලැබියයුතු දෑ ලෙස ලාභ හෝ අලාභ වල හඳුනාගැනේ.

15.4 ලැබිය යුතු දෑ ලෙස පෙන්වන වටිනාකම් අයකර ගැනීමේ හැකියාවේ ප්‍රමාණය තක්සේරු කිරීමට වාර්තා කරන කාලපරිච්ඡේදය අවසානයේ වන ලැබිය යුතු දෑ වල වටිනාකම අස්තිත්ත්වයක් සමාලෝචනය කළ යුතුය. වත්කම් සහ වගකීම් ප්‍රකාශනයේ වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ ලෙස හඳුනාගත් දෑ වලින් අයකරගත හැකිවනු ඇති වටිනාකම මැණ වෙනස

ලාභ හෝ අලාභවල ලැබිය යුතු දෑවල හානිකරණ දීමනාව ලෙස හඳුනාගත යුතුය.

### ලැයිස්තුගත සමාගම්වල කොටස්

15.5 අදාළ කොටස් හුවමාරුව මගින් ක්‍රමානුකූලව හෙළිදරව් කරන වාර්තා කරන කාලපරිච්ඡේදය අවසානයට පෙර අවසාන වෙළඳ කාලපරිච්ඡේදයේ තුළ වෙළඳාම් වූ පරිමා බැර තැබූ සාමාන්‍ය මිලට කොටස් වෙළඳපොළක විකුණන කොටස් මැනිය යුතුය.

15.6 කොටස් හුවමාරුවක ලැයිස්තුගත කොටසක් එම හුවමාරුවේ වෙළඳාම් කිරීම වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදය අවසානයේ අත්හිටුවා ඇත්නම් එම කොටස් වත්කම් සහ වගකීම් ප්‍රකාශනයේ අස්තිත්ත්වයක් මැනිය යුත්තේ එම දින වඩාත්ම අපේක්ෂා කළ හැකි වටිනාකමටය.

### වෙනත් සමාගම් වල කොටස්

15.7 කොටස් හුවමාරුවක මිල කියුම් නොලත් සමාගමක කොටස් මැනිය යුත්තේ පිරිවැයට හෝ ශුද්ධ වත්කම් වල අගය වන වටිනාකම් වලින් අඩු වටිනාකමටය. කොටස්වල ශුද්ධ වටිනාකම සොයා දැනගත යුත්තේ එම අස්තිත්ත්වයේ පොදු අරමුණ මත පදනම් මූල්‍ය ප්‍රකාශන වලිනි.

### ගෙවිය යුතු ණය

15.8 ආපසු ගෙවිය යුතු වටිනාකමට ගෙවිය යුතු ණය අස්තිත්ත්වයක් මැනිය යුතුය.

15.9 ණය මුදලක් එක වර්ෂයක් ඇතුළත ආපසු ගෙවිය යුතු වටිනාකම ණය මුදල ගත් අවස්ථාවේ සිට එක වසරකට පසුව ආපසු ගෙවිය යුතු වටිනාකමට වඩා අඩුනම් එය ජංගම නොවන වගකීමක් ලෙස වර්ගීකරණය කෙරේ. වෙනත් යම් ණය මුදල් ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කෙරේ.

15.10 වාර්තාකරනු ලබන කාලපරිච්ඡේදය අවසානය දක්වා නොගෙවූ උපචිත වූ පොලිය වගකීමක් ලෙස වත්කම් සහ වගකීම් ප්‍රකාශනයේ හඳුනා ගැනේ.

### වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ

15.11 අස්තිත්ත්වයක් වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ මූලිකව මැන හඳුනාගත යුත්තේ ගනුදෙනු වූ මිලටය.

15.12 වාර්තාකරන ලබන කාලපරිච්ඡේදය අවසන ගෙවීමට ඉතිරිව ඇති ගෙවිය යුතු දෑ වගකීමක් ලෙස වත්කම් සහ වගකීම් ප්‍රකාශනයේ හඳුනාගැනේ.

### ලාභ හෝ අලාභ මත බදු

15.13 වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදය අවසානය දක්වා එහි ලාභ හෝ අලාභ මත බදු වශයෙන් ගෙවිය යුතු වටිනාකම අදාළ ව්‍යවස්ථාවන් ප්‍රකාරව ගණනය කළ ගෙවිය යුතු වටිනාකම පදනම මත අස්තිත්ත්වයක් හඳුනාගත යුතුය.

### හෙළිදරව් කිරීම්

15.14 අස්තිත්ත්වයක් පහත සඳහන් අයිතම හෙළිදරව් කළ යුතුය:

(අ) ලාභ හෝ අලාභ වල අයකරගත නොහැකි ලැබිය යුතු දෑවල හඳුනාගත් වටිනාකම්;

(ආ) ලාභ හෝ අලාභවල ලැබිය යුතු දෑ හානිකරණය සඳහා දීමනා ලෙස හඳුනාගත් වටිනාකම්; සහ

(ඇ) වාර්තාකරන ලබන කාලපරිච්ඡේදය අවසානයේ කල්ඉකුත් වූ වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑවල වයස් විශ්ලේෂණයක්.

## *16 වන පරිච්ඡේදය - වාර්තාකරන ලද කාලපරිච්ඡේදයට පසුව සිදුවන සිදුවීම්*

### වාර්තා කරන ලද කාලපරිච්ඡේදයට පසුව සිදුවන සිද්ධීන් අර්ථ නිරූපණය

16.1 වාර්තා කරන ලද කාලපරිච්ඡේදයට පසුව සිදුවන සිද්ධින් වනුයේ වාර්තා කරන ලද කාලපරිච්ඡේදය අවසන සහ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමත කරන දිනය අතර සිදුවන සිද්ධීන්ය.

### හඳුනා ගැනීම සහ මැනීම

#### වාර්තාකරන ලද කාලපරිච්ඡේදය අවසානයට පසුව ගලපනු ලබන සිද්ධින්

16.2 වාර්තාකරන ලද කාලපරිච්ඡේදය අවසානයට පසුව ගලපනු ලබන සිද්ධීන් පිළිබිඹුවීමට අස්තිත්ත්වයක් එහි මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත් වටිනාකම් ගැලපිය යුතු හෝ සම්බන්ධිත හෙළිදරව් කිරීමක් ඇතුළුව කලින් හඳුනා නොගත් අයිතම හඳුනාගත යුතුය. වාර්තා කරන ලද කාලපරිච්ඡේදයට පසුව ගලපනු ලබන සිද්ධීන් වනුයේ වාර්තා කරන ලද කාලපරිච්ඡේදය අවසානයේ පැවති සිද්ධීන්වල පැවති තත්ත්වයන්ට සාක්ෂි ලබාදෙන සිද්ධීන්ය.

16.3 උදාහරණලට ඇතුළත් වන්නේ:

(අ) වාර්තා කරන ලද කාලපරිච්ඡේදය අවසානයේදී වත්කමක් හානිකරණය වී ඇතැයි හෝ එම වත්කම සඳහා කලින් හඳුනාගත් හානිකරණය ගැලපිය යුතුබව ඇඟවෙන තොරතුරු වාර්තා කරන ලද කාලපරිච්ඡේදයට පසුව ලැබීම, උදාහරණ වශයෙන්:

(i) වාර්තා කරන ලද කාලපරිච්ඡේදය අවසානයට පසුව සිදුවන ගනුදෙනුකරුවෙක් බුන්වත් වීම වාර්තාකරන ලද කාලපරිච්ඡේදය අවසාන වෙළඳ ලැබිය යුතු දෑ මත අලාභයක් පැවති බව සනාථ කිරීම සුලබව සිදුවේ සහ ලැබියයුතු දෑවල ධාරණ වටිනාකම අස්තිත්ත්වය විසින් ගැලපිය යුතු වේ; සහ

(ii) එම දින අය කරගත හැකි වටිනාකම තක්සේරු කිරීමේ අරමුණ සඳහා වාර්තා කරන ලද කාලපරිච්ඡේදය අවසානයට පසුව තොග විකිණීම මගින් වාර්තාකරන කාලපරිච්ඡේදය අවසන ඒවායේ විකුණුම් මිල පිළිබඳ සාක්ෂි ලබා දිය හැකිය.

(ආ) වාර්තා කරන ලද කාලපරිච්ඡේදය අවසානයට පෙර මිලදීගත් වත්කම් වල පිරිවැය හෝ විකුණූ වත්කම් වලින් ලැබූ මුදල් වාර්තා කරන ලද කාලසීමාව අවසානයට පසුව නිර්ණය කිරීම.

### වාර්තා කරන ලද කාලපරිච්ඡේදය අවසානයට පසුව නොගලපනු ලබන සිද්ධීන්

16.4 වාර්තාකරන ලද කාලපරිච්ඡේදය අවසානයට පසු නොගැලපිය යුතු සිද්ධීන් පිළිබිඹුවීමට එහි මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත් වටිනාකම් අස්තිත්ත්වයක් විසින් නොගැලපිය යුතුය. වාර්තා කරන ලද කාලපරිච්ඡේදය අවසානයට පසුව නොගැලපිය යුතු සිද්ධීන් වනුයේ වාර්තාකරන ලද කාලපරිච්ඡේදය අවසානයට පසුව පැන නැඟුන තත්ත්වයන් හඟවන සිද්ධීන්ය.

16.5 වාර්තා කරන ලද කාලපරිච්ඡේදය අවසානයට පසු නොගලපනු ලබන සිද්ධීන් වලට උදාහරණ වන්නේ, වාර්තා කරන ලද කාලපරිච්ඡේදය අවසානයට පසුව ඇති වූ ගංවතුර, ගින්නක් හෝ වෙනත් සිද්ධීන්ගෙන් වන අලාභයන්ය.

### ලාභාංශ

16.6 වාර්තාකරන ලද කාලපරිච්ඡේදයට පසුව අස්තිත්ත්වයක් එහි කොටස් හිමියන්ට ලාභාංශ ප්‍රකාශ කළහොත් එම ලාභාංශ වාර්තාකරන ලද පරිච්ඡේදය අවසානයේ වගකීමක් ලෙස හඳුනා නොගත යුතුය.

## හෙළිදරව් කිරීම

### නිකුත් කිරීම සඳහා අනුමත කළ දිනය

16.7 මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමැතිය දුන්නේ කුමන දිනයකදී සහ අනුමැතිය දුන්නේ කවුරුන්දැයි අස්තිත්ත්වය හෙළිදරව් කළ යුතුය.

## *17 වන පරිච්ඡේදය - කුඩා අස්තිත්ත්ව සඳහා SLFRS වෙත සංක්‍රාන්තිය*

### විෂය පථය

17.1 මුල්වරට SLFRS තෝරාගන්නා කුඩා අස්තිත්ත්ව එහි පෙර වූ මූල්‍ය වාර්තාකරණය වූයේ SLFRSs, සුකුපඅ සඳහා වන SLFRS හෝ යම් වෙනත් පදනමක් මත වූයේද යන්න නොසලකා මෙම පරිච්ඡේදය ව්‍යවහාර වේ.

### මුල් වරට තෝරාගැනීම

17.2 මුල්වරට SLFRS තෝරාගන්නා කුඩා අස්තිත්ත්ව සඳහා වන SLFRS වලට අනුකූල එහි ප්‍රථම මූල්‍ය ප්‍රකාශන සඳහා මෙම පරිච්ඡේදයේ අවශ්‍යතාවයන් ව්‍යවහාර කළ යුතුය.

17.3 කුඩා අස්තිත්ත්ව සඳහා වන SLFRS වලට අනුගතවන අස්තිත්ත්වයේ ප්‍රථම මූල්‍ය ප්‍රකාශන වනුයේ, එම මූල්‍ය ප්‍රකාශන කුඩා පරිමාණ අස්තිත්ත්ව සඳහා වන SLFRS වලට අනුකූලව පිළියෙළ කර ඇති බවට අස්තිත්ත්වය පැහැදිලි සහ සීමාරහිත ප්‍රකාශයන් කරන ප්‍රථම වාර්ෂික මූල්‍ය ප්‍රකාශන වේ. අස්තිත්ත්වය;

(අ) කලින් වූ කාලපරිච්ඡේද සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකර ඇත්නම්,

(ආ) සියලුම කරුණු සම්බන්ධයෙන් කුඩා අස්තිත්ත්ව සඳහා වන SLFRS සමග අනුකූල නොවන මූලධර්ම පදනම් කර වඩාත් මෑතක පෙර වූ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇතිවිට,

(ඇ) SLFRSs හෝ කුමපඅ සඳහා SLFRS වලට අනුගතව වඩාත් මෑතක පෙර වූ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇතිවිට,

වන්නේ නම් මෙම ප්‍රමිතය ප්‍රකාරව පිළියෙළ කළ මූල්‍ය ප්‍රකාශන අස්තිත්ත්වයේ එවැනි මූල්‍ය ප්‍රකාශන වන්නේය.

17.4 කුඩා අස්තිත්ත්ව සඳහා අස්තිත්ත්වය සංක්‍රාන්ති වූ දිනය වනුයේ, කුඩා අස්තිත්ත්ව සඳහා වන SLFRS වලට අනුගතව අස්තිත්ත්වය ඉදිරිපත් කරන එහි ප්‍රථම මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදයේ ආරම්භයයි. කුඩා අස්තිත්ත්ව සඳහා සංක්‍රාන්ති වූ දිනයට වත්කම හා වගකීම්වල ආරම්භක ප්‍රකාශනයක් අස්තිත්ත්වය පිළියෙළ කළ යුතුය.

## සංක්‍රාන්ති වූ දින මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සඳහා වන ක්‍රියාපටිපාටිය

17.5 පසුව දක්නට ලැබෙන පරිච්ඡේදයන්හි ප්‍රතිපාදනය කර ඇති ලෙස හැර, එහි ආරම්භක වත්කම් සහ වගකීම් ප්‍රකාශනයේ අස්තිත්ත්වයක් (කුඩා පරිමාණ අස්තිත්ත්ව සඳහා SLFRS වලට සංක්‍රාන්ති වූ දිනට):

(අ) කුඩා අස්තිත්ත්ව සඳහා වන SLFRS මගින් හඳුනාගැනීම අවශ්‍ය කරන සියලු වත්කම් සහ වගකීම් හඳුනාගත යුතුය;

(ආ) කුඩා අස්තිත්ත්ව සඳහා වන SLFRS මගින් එවැනි හඳුනා ගැනීමට අවසර දෙන්නේ නැතිනම්, වත්කම් හෝ වගකීම් ලෙස අයිතම හඳුනාගනු නොලැබේ;

(ඇ) මූල්‍ය වාර්තාකරණයේ කුලී පදනම යටතේ අස්තිත්ත්වය හඳුනාගත් එක් එක් අයිතමය එක වර්ගයක වත්කම්, වගකීම් හෝ ස්කන්ධයේ සංරචකයක් ලෙස ප්‍රතිවර්ගීකරණය කිරීම, එහෙත් කුඩා පරිමාණ අස්තිත්ත්ව සඳහා වන SLFRS යටතේ වෙනස් වර්ගයක වත්කමක්, වගකීමක් හෝ ස්කන්ධයේ සංරචකයක් වේ; සහ

(ඈ) හඳුනාගත් සියලු වත්කම් සහ වගකීම් මැනීමේදී කුඩා අස්තිත්ත්ව සඳහා වන SLFRS ව්‍යවහාර කිරීම.

17.6 අස්තිත්ත්වයක් එහි ආරම්භක වත්කම් සහ වගකීම් ප්‍රකාශනයේ (කුඩා අස්තිත්ත්ව සඳහා වූ SLFRS වලට සංක්‍රමණය වූ දිනට) ගිණුම්කරණ ප්‍රතිපත්ති, එය පෙර වූ මූල්‍ය වාර්තාකරණය සඳහා භාවිත කළ පදනමට වඩා කුඩා අස්තිත්ත්ව සඳහා වූ SLFRS යටතේ වෙනස් විය හැකිය. කුඩා අස්තිත්ත්වය සඳහා වූ SLFRS වලට සංක්‍රමණය වූ දිනට පෙර වූ ගනුදෙනුවලින්, වෙනත් සිද්ධීන් හෝ තත්ත්වයන්ගේ ප්‍රතිඵලයන් වන ගැලපුම් පැනනගී. එබැවින් අස්තිත්ත්වයක් කුඩා අස්තිත්ත්ව සඳහා වන SLFRS වලට සංක්‍රමණය වූ දිනට එම ගැලපුම් රඳවාගත් ඉපයීම්වලට (හෝ, උචිත වන්නේ නම් ස්කන්ධයේ වෙනත් ප්‍රභේදනයක්) හඳුනාගත යුතුය.

17.7 SLFRSs හෝ කුමපඅ සඳහා SLFRS වලට අනුකූලව එහි වඩාත් මෑතක පෙර වූ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ අස්තිත්ත්වයක්, එහි මූල්‍ය ප්‍රකාශන මෙම ප්‍රමිතයට අනුව ඉදිරිපත් කිරීමේදී SLFRSs හෝ කුමපඅ සඳහා SLFRS වලට අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී භාවිත කළ දේපළ, පිරියත හෝ උපකරණ අයිතමයක ප්‍රත්‍යාගණිත වටිනාකම්, එවැනි

ප්‍රත්‍යාගණනයක් කල දිනයේ එම අයිතමයේ ධාරන වටිනාකම ලෙස භාවිතා කිරීමට අස්තිත්ත්වය තෝරාගත හැකිය.

## තුළනාත්මක තොරතුරු ඉදිරිපත් කිරීම

17.8 කුඩා අස්තිත්ත්ව සඳහා SLFRS වලට අනුගතව වන එහි ප්‍රථම මූල්‍ය ප්‍රකාශනවල මෙම ප්‍රමිතය අනුව පිළියෙළ කළ එහි ආරම්භක වත්කම් හා වගකීම් ප්‍රකාශනය (කුඩා අස්තිත්ත්වයක් සඳහා වන SLFRS වලට සංක්‍රමණය වූ දින) එහි තුලනාත්මක තොරතුරු ලෙස අස්තිත්ත්වයක් ඉදිරිපත් කළ යුතුය.

17.9 කුඩා අස්තිත්ත්ව සඳහා වන SLFRS භාවිත කර පිළියෙළ කළ එහි ප්‍රථම මූල්‍ය ප්‍රකාශනවල කලින් මූල්‍ය කාලපරිච්ඡේදය සම්බන්ධිත තුලනාත්මක තෙරතුරු ලාභ හෝ අලාභ සහ රඳවාගත් ඉපයීම් ප්‍රකාශනයේ එම කාලපරිච්ඡේදය සඳහා අස්තිත්ත්වය ඉදිරිපත් කළ පොදු අරමුණු මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනීමේ එම මැනීමේ මූලධර්ම පදනම මත අස්තිත්ත්වයක් ඉදිරිපත් කළ හැකි අතර එම කරුණ සටහන් තුළ හෙළිදරව් කළ යුතුය.

## හෙළිදරව් කිරීම්

### කුඩා අස්තිත්ත්ව SLFRS වලට සංක්‍රමණය වීම පහදා දීම

17.10 අස්තිත්ත්වය එහි පෙර වූ මූල්‍ය වාර්තාකරන පදනමේ සිට කුඩා අස්තිත්ත්ව සඳහා වන SLFRS වලට සංක්‍රමණයවීමේදී වාර්තාකරන ලද ස්කන්ධයට සහ මූල්‍ය කාර්ය සාධනයට එය කෙසේ බලපෑවේද යන්න පහදා දිය යුතුය.

### සංසන්දනය කිරීම්

17.11 පූර්වගාමී ඡේදය සමග අනුකූලවීමට, කුඩා අස්තිත්ත්ව සඳහා SLFRS භාවිත කර පිළියෙළ කළ අස්තිත්ත්වයේ ප්‍රථම මූල්‍ය වාර්තාකරන ප්‍රකාශනයේ අස්තිත්ත්වය විසින්:

(අ) වෙනස් වූ සෑම ගිණුම්කරණ ප්‍රතිපත්තියකම ස්වභාවය පිළිබඳ විස්තරයක්; සහ

(ආ) කලින් භාවිත කළ මූල්‍ය වාර්තා කරන පදනම ප්‍රකාරව නිර්ණය කළ එහි ස්කන්ධය සමග කුඩා පරිමාණයේ අස්තිත්ත්ව සඳහා SLFRS වල සංක්‍රමණය වූ දින කුඩා පරිමාණයේ අස්තිත්ත්ව සඳහා වන SLFRS ප්‍රකාරව නිර්ණය කළ එහි ස්කන්ධය සංසන්දනය කිරීමක්.

17.12 අස්තිත්ත්වයක් පොදු අරමුණ මූල්‍ය ප්‍රකාශනයක් කලින් කාලපරිච්ඡේද සඳහා ඉදිරිපත් කර නොමැති නම්, කුඩා අස්තිත්ත්වය සඳහා වන SLFRS සමග අනුකූලවන එහි ප්‍රථම මූල්‍ය ප්‍රකාශනවල එම කරුණ හෙළිදරව් කළ යුතුය.

## බලාත්මක දිනය

17.13 2016 ජනවාරි මස 01 දින හෝ ඉන් පසුව ආරම්භවල කාලපරිච්ඡේද ආවරණය වන මූල්‍ය ප්‍රකාශන සඳහා කුඩා අස්තිත්ත්ව සඳහා වන SLFRS බල පැවැත්වේ. කලින් ව්‍යවහාරකරණයට අවසර දේ. අස්තිත්ත්වයක් මෙම

ප්‍රමිතය 2016 ජනවාරි 01 දිනට පෙර ආරම්භවන කාලපරිච්ඡේද සඳහා ව්‍යවහාර කරන්නේ නම් එම කරුණ හෙළිදරව් කළ යුතුය.

## මූල්‍ය ප්‍රකාශන නිදර්ශනාත්මක ඉදිරිපත් කිරීම

*කුඩා පරිමාණ අස්තිත්ත්ව සඳහා වන SLFRS කැටුව ඇති නිදර්ශනාත්මකව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම එහෙත් මෙය ප්‍රමිතයේ කොටසක් නොවේ.*

**<අස්තිත්ත්වයේ නම>**

**20×2 මාර්තු 31 වන දින වත්කම් සහ වගකීම් ප්‍රකාශනය**

| මාර්තු 31 වන දිනට | 20×2 | 20×1 |
|---|---|---|
| | රු. | රු. |
| ***වත්කම්*** | | |
| ***ජංගම නොවන වත්කම්*** | | |
| දේපළ, පිරියත සහ උපකරණ | × | × |
| මිල කියුම් නොලත් සමාගම්වල කොටස් | × | × |
| දිගුකාලීන - බැංකු තැන්පතු | × | × |
| | × | × |
| ***ජංගම වත්කම්*** | | |
| තොග | × | × |
| මිල කියුම්ලත් සමාගම්වල කොටස් | × | × |
| සම්බන්ධිත පාර්ශ්ව වලින් ලැබිය යුතු දෑ | × | × |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | × | × |
| මුදල් හා මුදල් හා සමාන දෑ | × | × |
| | × | × |
| ***මුළු වත්කම*** | | |
| ***ස්කන්ධය සහ වගකීම්*** | | |
| ***ස්කන්ධය*** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | × | × |
| රඳවාගත් ඉපයීම් | × | × |
| මුළු ස්කන්ධය | × | × |
| ***ජංගම නොවන වගකීම්*** | | |
| දිගුකාලීන - බැංකු ණය | × | × |
| දිගුකාලීන - ණය | × | × |
| දිගුකාලීන සේවක ප්‍රතිලාභ බැඳියාවන් | × | × |
| | × | × |
| ***ජංගම වගකීම්*** | | |
| කෙටිකාලීන බැංකු ණය | × | × |
| ගෙවිය යුතු බදු | × | × |
| සම්බන්ධිත පර්ශ්වවලට ගෙවිය යුතු දෑ | × | × |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | × | × |
| | × | × |
| ***මුළු වගකීම්*** | × | × |
| ***ස්කන්ධ හා වගකීම්*** | × | × |

<අස්තිත්ත්වයේ නම>

**20X2 මාර්තු 31 න් අවසන් වූ වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ රඳවාගත් ඉපයීම් ප්‍රකාශනය**

| මාර්තු 31 න් අවසන් වර්ෂය | 20×2<br>රු. | 20×1<br>රු. |
|---|---|---|
| **අයභාරය** | × | × |
| විකුණුම් පිරිවැය | (×) | (×) |
| දළ ලාභය | × | × |
| වෙනත් ආදායම් | × | × |
| බෙදාහැරීමේ පිරිවැය | (×) | (×) |
| පරිපාලන වියදම් | (×) | (×) |
| වෙනත් වියදම් | (×) | (×) |
| මූල්‍ය පිරිවැය | (×) | (×) |
| බදුවලට පෙර ලාභය | × | × |
| ආදායම් බදු | (×) | (×) |
| **වර්ෂය සඳහා ලාභය** | × | × |
| | | |
| **රඳවාගත් ඉපයීම්** | | |
| වර්ෂයේ ආරම්භයේ රඳවාගත් ඉපයීම් | × | × |
| පූර්වකාල වැරදි නිවැරදි කිරීම් | × | × |
| පූර්ව කාලපරිච්ඡේදවලට සම්බන්ධිත ගිණුම්කරන ප්‍රතිපත්තිවල වෙනස්වීම් මත බලපෑම් | × | × |
| වර්ෂය ආරම්භයේදී ගලපන ලද රඳවාගත් ඉපයීම් | × | × |
| වර්ෂය සඳහා ලාභය | (×) | (×) |
| ලාභාංශ | × | × |
| වර්ෂය අවසානයේ රඳවාගත් ඉපයීම් | × | × |

**<අස්තිත්ත්වයේ නම>**

**20×2 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

| | | |
|---|---|---|
| *මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහ* | රු. | රු. |
| බදුවලට පෙර ලාභය | × | |
| පහත දෑ සඳහා ගැලපුම් | | |
| ක්ෂය කිරීම | × | |
| ආයෝජන ආදායම් | (×) | |
| පොළී වියදම | × | |
| | × | |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑවල වැඩිවීම් | (×) | |
| තොග අඩුවීම | × | |
| වෙළඳ ගෙවිය යුතු දෑ අඩුවීම | (×) | |
| මෙහෙයුම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහ | × | |
| ගෙවූ පොලී | (×) | |
| ගෙවූ ආදායම් බදු | (×) | |
| *මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහ* | × | × |
| *ආයෝජන ක්‍රියාකාරකම් වලින් වන මුදල් ප්‍රවාහ* | | |
| දේපළ, පිරියත සහ උපකරණ මිලදී ගැනීම් | (×) | |
| උපකරණ විකිණීමෙන් ලත් මුදල් | × | |
| ලැබුන පොලී | × | |
| ලැබුණ ලාභාංශ | × | |
| *ආයෝජන ක්‍රියාකාරකම්වල භාවිත කළ ශුද්ධ මුදල්* | | (×) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහ** | | |
| කොටස් ප්‍රාග්ධනය නිකුත් කිරීමෙන් ලද මුදල් | × | |
| දිගුකාලීන ණයගැනීම් වලින් ලත් මුදල් | × | |
| ගෙවූ ලාභාංශ | (×) | |
| මූල්‍ය ක්‍රියාකාරකම්වල භාවිත කළ ශුද්ධ මුදල් | | (×) |
| **මුදල් හා මුදල් හා සමාන දෑවල ශුද්ධ වැඩිවීම** | | × |
| **කාලපරිච්ඡේද ආරම්භයේදී මුදල් හා මුදල් හා සමාන දෑ** | | × |
| **කාලපරිච්ඡේදය අවසානයේ මුදල් හා මුදල් හා සමාන දෑ** | | × |

## SLFRSසමග සංසන්දනය කිරීම

*SLFRSs සමග සංසන්දනය කිරීම කුඩා අස්තිත්ත්ව සඳහා වන SLFRS සමග කැටුව යයි. එහෙත් එය මෙම ප්‍රමිතයේ කොටසක් නොවේ.*

| **SLFRSයොමුව** | **SLFRSහි විස්තරය** | **කුඩා අස්තිත්ත්ව සඳහාවනSLFRS හි අවශ්‍යතා** |
|---|---|---|
| SLFRS 1 | ප්‍රථම වරට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLFRS) භාවිත කිරීම | සරල කර ඇත |
| SLFRS 2 | කොටස් පදනම් ගෙවීම් | ඇතුළත් කර නැත |
| SLFRS 3 | ව්‍යාපාර සංයෝජන | ඇතුළත් කර නැත |
| SLFRS 4 | රක්ෂණ ගිවිසුම් | ඇතුළත් කර නැත |
| SLFRS 5 | විකිණීම සඳහා තබාගෙන ඇති සහ අසන්තතික මෙහෙයුම් | ඇතුළත් කර නැත |
| SLFRS 6 | ඛණිජ සම්පත් සඳහා ගවේෂණය සහ ඇගයීම | ඇතුළත් කර නැත |
| SLFRS 7 | මූල්‍ය සාධන පත්‍ර හෙළිදරව් කිරීම | වෙනස් කර ඇත |
| SLFRS 8 | මෙහෙයුම් ඛණ්ඩ | ඇතුළත් කර නැත |
| SLFRS 9 | මූල්‍ය සාධන පත්‍ර | ඇතුළත් කර නැත |
| SLFRS 10 | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන | ඇතුළත් කර නැත |
| SLFRS 11 | බද්ධ විධිවිධාන | ඇතුළත් කර නැත |
| SLFRS 12 | වෙනත් අස්තිත්ත්වයන්හි ඇල්ම හෙළිදරව් කිරීම | ඇතුළත් කර නැත |
| SLFRS 13 | සාධාරණ අගය මැණීම | ඇතුළත් කර නැත |
| SLFRS 14 | නියාමන විලම්භන ගිණුම | ඇතුළත් කර නැත |
| SLFRS 15 | ගනුදෙනුකරුවන් සමග ගිවිසුම්වලින් වන අයභාරය | වෙනස් කර ඇත |
| LKAS 1 | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම | සරල කර ඇත |
| LKAS 2 | තොග | සරල කර ඇත |
| LKAS 7 | මුදල් ප්‍රවාහ ප්‍රකාශ | සරල කර ඇත |
| LKAS 8 | ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි | සරල කර ඇත |
| LKAS 10 | වාර්තාකරන කාලපරිච්ඡේදයට පසු සිදුවීම් | සරල කර ඇත |
| LKAS 11 | ඉදිකිරීම් කොන්ත්‍රාත්තු | සරල කර ඇත |
| LKAS 12 | ආදායම් බදු | වෙනස් කර ඇත |
| LKAS 16 | දේපළ, පිරියත සහ උපකරණ | සරල කර ඇත |
| LKAS 17 | කල්බදු | වෙනස් කර ඇත |
| LKAS 18 | අයභාරය | සරල කර ඇත |
| LKAS 19 | සේවක ප්‍රතිලාභ | වෙනස් කර ඇත |
| LKAS 20 | රාජ්‍ය ප්‍රදාන සඳහා ගිණුම්කරණය සහ රාජ්‍ය අනුග්‍රහයන් හෙළිදරව් කිරීම | සරල කර ඇත |
| LKAS 21 | විදේශ විනිමය අනුපාතිකයන්හි වෙනස්වීමේ බලපෑම | සරල කර ඇත |
| LKAS 23 | ණය ගැනුම් පිරිවැය | වෙනස් කර ඇත |

| **SLFRS**යොමුව | **SLFRS**හි විස්තරය | කුඩා අස්තිත්ත්ව සඳහාවනSLFRS හි අවශ්‍යතා |
|---|---|---|
| LKAS 24 | සම්බන්ධිත පාර්ශ්වයන් හෙළිදරව් කිරීම | සරල කර ඇත |
| LKAS 26 | විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් ගිණුම්කරණය සහ වාර්තාකරණය | ඇතුළත් කර නැත |
| LKAS 27 | ඒකාබද්ධ සහ වෙන් වශයෙන් වූ මූල්‍ය ප්‍රකාශන | ඇතුළත් කර නැත |
| LKAS 28 | ආශ්‍රිතයන්හි ආයෝජන | ඇතුළත් කර නැත |
| LKAS 29 | අතිඋද්දමනකාරි ආර්ථිකයන්හි මූල්‍ය වාර්තාකරණය | ඇතුළත් කර නැත |
| LKAS 31 | බද්ධ ව්‍යාපාරයන්හි හිමිකම් | ඇතුළත් කර නැත |
| LKAS 32 | මූල්‍ය සාධන පත්‍ර - ඉදිරිපත් කිරීම | වෙනස් කර ඇත |
| LKAS 33 | කොටසක ඉපැයුම් | ඇතුළත් කර නැත |
| LKAS 34 | අතුරු මූල්‍ය වාර්තාකරණය | ඇතුළත් කර නැත |
| LKAS 36 | වත්කම් හානිකරණය | වෙනස් කර ඇත |
| LKAS 37 | ප්‍රතිපාදන අසම්භව්‍ය වගකීම් සහ අසම්භව්‍ය වත්කම් | සරල කර ඇත |
| LKAS 38 | අස්පෘශ්‍ය වත්කම් | ඇතුළත් කර නැත |
| LKAS 39 | මූල්‍ය සාධන පත්‍ර හඳුනාගැනීම සහ මැනීම | වෙනස් කර ඇත |
| LKAS 40 | ආයෝජන දේපළ | වෙනස් කර ඇත |
| LKAS 41 | කෘෂිකර්මය | ඇතුළත් කර නැත |

**සරල කර ඇත,** යන්නෙන් අදහස් වන්නේ ප්‍රමිතය පදනම් වූ මූලධර්ම මත සැලකිය යුතු අන්දමේ වෙනස්කම් නොකර අවශ්‍යතාවයන් සරලකරණය කිරීමය.

**වෙනස් කර ඇත,** යන්නෙන් අදහස් වන්නේ සංකීර්ණතාවය අඩු කිරීමට සහ කුඩා පරිමාණ අස්තිත්ත්ව සඳහා පිරිවැය පිරිමැසුම්දායකත්වය වඩා යහපත් බවට පමුණුවාලීමට අවශ්‍යතාවයන් සැලකිය යුතු අන්දමින් වෙනස් කර තිබීමය.

**ඇතුළත් කර නොමැත,** යන්නෙන් අදහස් වන්නේ ප්‍රමිතයේ අවශ්‍යතාවයන් ඇතුළත් නොකිරීමයි.

## කුමපඅ සඳහා වන SLFRS සමග සංසන්දනය කිරීම

| කුමපඅ සඳහාවන SLFRS හි පරිච්ඡේදය | කුමපඅ සඳහා SLFRS පරිච්ඡේදයට විස්තර | කුඩා අස්තිත්ත්ව සඳහාවනSLFRS හි අවශ්‍යතා |
|---|---|---|
| 1 | කුඩා හා මධ්‍යම පරිමාණයේ අස්තිත්ත්ව | අදාළ නොවේ |
| 2 | සංකල්ප සහ පෘතුල මූලධර්ම | සරල කර ඇත |
| 3 | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම | සරල කර ඇත |
| 4 | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | සරල කර ඇත |
| 5 | විස්තීර්ණ ආදායම් සහ ආදායම් ප්‍රකාශනය | සරල කර ඇත |
| 6 | ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ ආදායම් සහ රඳවාගත් ඉපයීම් ප්‍රකාශනය | සරල කර ඇත |
| 7 | මුදල් ප්‍රවාහ ප්‍රකාශ | සරල කර ඇත |
| 8 | මූල්‍ය ප්‍රකාශනවලට සටහන් | සරල කර ඇත |
| 9 | ඒකාබද්ධ සහ වෙන්ව වූ මූල්‍ය ප්‍රකාශන | ඇතුළත් කර නැත |
| 10 | ගිණුම්කරණ ප්‍රතිපත්ති ඇස්තමේන්තු සහ වැරදි | සරල කර ඇත |
| 11 | මූලික මූල්‍ය සාධන පත්‍ර | වෙනස් කර ඇත |
| 12 | වෙනත් මූල්‍ය සාධන පත්‍ර නිකුත් කිරීම | වෙනස් කර ඇත |
| 13 | තොග | සරල කර ඇත |
| 14 | ආශ්‍රිතවල ආයෝජන | ඇතුළත් කර නැත |
| 15 | බද්ධ ව්‍යාපාරවල ආයෝජන | ඇතුළත් කර නැත |
| 16 | ආයෝජන දේපළ | වෙනස් කර ඇත |
| 17 | දේපළ, පිරියත සහ උපකරණ | සරල කර ඇත |
| 18 | කීර්තිනාමය හැර වෙනත් අස්පෘශ්‍ය වත්කම් | ඇතුළත් කර නැත |
| 19 | ව්‍යාපාර සංයෝජනය සහ කීර්තිනාමය | ඇතුළත් කර නැත |
| 20 | කල්බදු | වෙනස් කර ඇත |
| 21 | ප්‍රතිපාදන සහ අසම්භව්‍යයන් | සරල කර ඇත |
| 22 | වගකීම් සහ ස්කන්ධය | වෙනස් කර ඇත |
| 23 | අයභාරය | සරල කර ඇත |
| 24 | රාජ්‍ය ප්‍රදාන | සරල කර ඇත |
| 25 | ණය ගැනුම් පිරිවැය | සරල කර ඇත |
| 26 | කොටස් පදනම් ගෙවීම | ඇතුළත් කර නැත |
| 27 | වත්කම් හානිකරණය | වෙනස් කර ඇත |
| 28 | සේවක ප්‍රතිලාභ | වෙනස් කර ඇත |
| 29 | ආදායම් බදු | වෙනස් කර ඇත |
| 30 | විදේශ විනිමය පරිවර්තනය | සරල කර ඇත |

| කුමපඅ සඳහාවන SLFRS හි පරිච්ඡේදය | කුමපඅ සඳහා SLFRS පරිච්ඡේදයට විස්තර | කුඩා අස්තිත්ත්ව සඳහාවනSLFRS හි අවශ්‍යතා |
|---|---|---|
| 31 | අති උද්ධමනය | ඇතුළත් කර නැත |
| 32 | වාර්තාකරනු ලබන කාලපරිච්ඡේදයට පසුව සිදුවන සිද්ධීන් | සරල කර ඇත |
| 33 | සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම | සරල කර ඇත |
| 34 | විශේෂිත ක්‍රියාකාරකම් | ඇතුළත් කර නැත |
| 35 | කුමපඅ සඳහා SLFRS වලට සංක්‍රාන්තිය | වෙනස් කර ඇත |

**සරල කර ඇත,** යන්නෙන් අදහස් වන්නේ ප්‍රමිතය පදනම් වූ මූලධර්ම මත සැලකිය යුතු අන්දමේ වෙනස්කම් නොකර අවශ්‍යතාවයන් සරලකරණය කිරීමය.

**වෙනස් කර ඇත,** යන්නෙන් අදහස් වන්නේ සංකීර්ණතාවය අඩු කිරීමට සහ කුඩා පරිමාණ අස්තිත්ත්ව සඳහා පිරිවැය පිරිමැසුම්දායකත්වය වඩා යහපත් බවට පමුණුවාලීමට අවශ්‍යතාවයන් සැලකිය යුතු අන්දමින් වෙනස් කර තිබීමය.

**ඇතුළත් කර නොමැත,** යන්නෙන් අදහස් වන්නේ ප්‍රමිතයේ අවශ්‍යතාවයන් ඇතුළත් නොකිරීමයි.